# සීමාසහිත ......................... විවිධ සේවා සමුපකාර සමිතියේ අතුරු ව්‍යවස්ථා

මෙම අතුරු ව්‍යවස්ථා සීමා සහිත ............ විවිධ සේවා සමුපකාර සමිතියේ .......... දින අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව වෙනුවට දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය හා ඒ සමඟ කියවෙන 2019 දකුණු පළාත් සමුපකාර සමිති රීති ඇතුළ නෛතික ප්‍රතිපාදනයන්ට අනුව සංශෝධිත ...... දින මෙම සමිතියේ මහා සභාව විසින් අනුමත කර ..... දින සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලද ...... දින සිට බලාත්මක අතුරු ව්‍යවස්ථා වන්නේය.

ලියා පදිංචි කළ අංකය : ...................... දිනය : .......................

## 1 කොටස
## පරමාර්ථ, අරමුණු, කාර්යයන් හා බලතල

1. **නාමය**

සමිතියේ නාමය "සීමාසහිත **.....................** විවිධ සේවා සමුපකාර සමිතිය" වන්නේය. මින් මතු මේ අතුරු ව්‍යවස්ථාවල ඊට සමිතිය යයි සඳහන් කරනු ලැබේ.

**2.** **බල ප්‍රදේශය**

සමිතියේ බල ප්‍රදේශය **මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛණයේ සඳහන් ග්‍රාම නිලධාරී වසම් වලින් සමන්විත** වන්නේය. එකී සමිති බල ප්‍රදේශ පැහැදිලිව දක්වන ලද සිතියමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ **පළමු උපලේඛණයට** යා කර තිබිය යුතුය. (පළමු උපලේඛණය පිටු අංක .... ඇතුළත් කර ඇත.)

**3.** **ලිපිනය හා ප්‍රධාන කාර්යාලය**

3.1 සමිතියේ ලිපිනය සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය වන්නේය. සමිතියේ ප්‍රධාන කාර්යාලය මෙම අතුරු ව්‍යවස්ථාවේ 2 වන වගන්තියෙන් විස්තර කරනු ලබන බල ප්‍රදේශය තුළ පිහිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභාවේ අනුමැතිය ඇතිව තීරණය කරනු ලබන ස්ථානයක පිහිටුවිය යුතු ය.

3.2 ලිපිනයෙහි වෙනසක් සිදුකල විට ඒ බව දින 07 තුළ සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත දැන්විය යුතු අතර සමිතියේ සාමාජිකයන්ට ද නොපමාව දැන්විය යුතු ය.

3.3 දකුණු පළාතේ පළාත් සභාවේ අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්ති පිටපතක්, ඒ අනුව සාදන ලද රීති මාලාවේ පිටපතක්, මෙම අතුරු ව්‍යවස්ථා පිටපතක්, කාරක නියෝගවල පිටපතක්,සමිතියේ සාමාජික නාම ලේඛණයක් හා අවසන් විගණන වාර්තාව සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටි අවස්ථාවක පරීක්ෂා කර බැලීම සඳහා මෙම ලිපිනය දරණ ස්ථානයේ තිබිය යුතුය.

**4.** **පරමාර්ථ**

4.1 සමිතියේ මූලික පරමාර්ථය වනාහි සමුපකාර ප්‍රතිපත්ති අනුව එහි සාමාජිකයින්ගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික අවශ්‍යතාවයන් සපුරාලීමත්,

සාමාජිකයන් තුළ සකසුරුවම්කම හා අන්‍යෝන්‍යාධාරය සහ ආත්මාධාරය පිලිබඳ හැඟීම් හා ව්‍යවහාරය දියුණු කිරීමත් වන්නේය.

4.2 සමිතියේ විශේෂිත පරමාර්ථ වනා හි

(අ) සාමාජිකයන්ගේ පාරිභෝගික, කෘෂිකාර්මික හා කාර්මික වශයෙන් ඇති පොදු ආර්ථික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා සේවාවන් උපරිම කාර්යක්ෂමතාවය මත සැපයීම,

(ආ) සාමාජිකයන්ට උපරිම ප්‍රයෝජන අත්වන අන්දමට ඔවුන්ගේ කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන මිලදී ගැනීම, රැස් කිරීම, ගබඩා කිරීම, සකස් කිරීම හා අලෙවි කිරීම,

(ඇ) සාමාජිකයන් තුළ ආත්ම විශ්වාසය දියුණුවන අන්දමට ඔවුන්ගේ ඉතිරිකිරීම් සහ තැන්පත් දියුණු කිරීමේ ක්‍රම හා විදි ඇති කිරීම සහ සාමාජිකයන්ට ණය පහසුකම් සැපයීම,

(ඈ) සමුපකාර සමිති අතර සහයෝගීතාව දියුණු කිරීම,

(ඉ) සමුපකාර අධ්‍යාපනය දියුණු කිරීම වේ.

## 5. බලතල

උක්ත පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා අනුව පහත සඳහන් කටයුතු කිරීමට සමිතියට බලතල ඇති වන්නේය.

(අ). සකසුරුවම්කම සහ මුදල් ඉතිරි කිරීම පිළිබඳ වැඩ පිළිවෙලවල් ඇති කිරීම.

(ආ). ගෘහස්ථ කටයුතු කෘෂිකර්මය සහ කර්මාන්ත සඳහා සාමාජිකයන්ට උවමනා ද්‍රව්‍ය සැපයීම.

(ඇ). සෑම වර්ගයේම බඩු භාණ්ඩවල තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම කරගෙන යාම.

(ඈ). සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් අරමුදල් ඇති කර ගැනීම, සාමාජිකයන්ට ණය සහ අත්තිකාරම් මුදල් සැපයීම, අවශ්‍ය විටෙක ණය ලබා ගැනීම, බැංකු ඇතුළු මූල්‍ය ආයතනවල හා වෙනත් සමූපකාර සමිතිවල මුදල් ආයෝජනය කිරීම.

(ඉ). කෘෂිකර්මයෙන් හා සත්ව පාලනයෙන් උපදවන ද්‍රව්‍ය හා ගෘහ කර්මාන්තයෙන් නිපදවන ද්‍රව්‍ය ගබඩා කිරීම, සකස් කිරීම සහ අලෙවි කිරීම.

(ඊ). සාමාජිකයින්ට රැකීරක්ෂාවල් සපයා දීම සඳහා කොන්ත්‍රාත් ක්‍රමයට හෝ වෙනත් ක්‍රමයකට හෝ නොයෙකුත්වැඩ කිරීම.

(උ). වෙනත් යම්කිසි ව්‍යාපෘතියක යෙදීම හෝ ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම හෝ යම්කිසි වෙළඳ ව්‍යාපාරයක් කරගෙන යෑම හෝ ව්‍යාපාරයක යෙදීම.

(ඌ). සමිතියේ පරමාර්ථයන්ට සම්බන්ධ යම් කාර්යයක් සඳහා ඉඩම්, ගොඩනැගිලි, හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපල මිලට ගැනීමෙන්, ඉදි කිරීමෙන්, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හා බද්දට ගැනීම හෝ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම

(එ). ඉහත සඳහන් පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා කිරීමට අවශ්‍ය සමිතියට වාසිදායක ගිවිසුම්වලට එළඹීම හා සියළු දෙයක්ම හෝ ඒවා ඉටුකර ගැනීමට අදාළ හෝ ආධාර හෝ වන සියළු දෙයක්ම සමිතිය සඳහා බලපැවැත්වෙන නෛතික ප්‍රතිපාදනයන්ට අනුව සිදු කිරීම.

## 2 කොටස

## සාමාජික සුදුසුකම්, ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, බලතල හා කාර්යයන්

**6. සාමාජිකත්වය**

මින් මතු ඇති අතුරු ව්‍යවස්ථාවල විධාන වලට යටත්ව පහත සඳහන් අය සාමාජිකයෝ වෙති. එනම්:-

අ. සාමාජිකත්වයට සුදුසුකම් ඇතිව ලියාපදිංචි කිරීමට යැවූ ඉල්ලුම්පත්‍රයට අත්සන් තබා යටත් පිරිසෙයින් එක සම්පූර්ණ කොටසක්වත් අයිති කරගත් අය.

ආ. පූර්ව අතුරු ව්‍යවස්ථාව අනුව නිසි පරිදි සාමාජිකත්වයට ඇතුළත් කරගත් අය සහ මෙම අතුරු ව්‍යවස්ථාව අනුව බඳවා ගනු ලබන සාමාජිකයන්

ඇ. නීති මාර්ගයෙන් වත්කම් හා බැරකම් මේ සමිතියට පවරන ලද්දා වූ විසුරුවා හරින ලද ලියාපදිංචි කළ සමූපකාර සමිතියක ඒ විසුරුවා හරින අවස්ථාවේ දී සාමාජිකත්වය දැරූ අය.

**7. සාමාජිකත්වයට සුදුසුකම්**

සාමාජිකත්වය සඳහා

(අ) වයස අවුරුදු 18 ට වැඩි වූ ද

(ආ) සමිතිය ක්‍රියාත්මක වන්නාවූ බල ප්‍රදේශය ඇතුලත පදිංචිව සිටින්නාවූ හෝ සේවයෙහි නියුක්තව සිටින්නාවූ හෝ නිශ්චල දේපල අයත්ව සිටින්නාවූ ද

(ඇ) සමිතිය විසින් ඉටු කරනු ලබන සේවාවන් උපයෝගි කිරීමේ ශක්නුතාවය ඇත්තාවූ ද අය සුදුසු වන්නේය.

**8. සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම**

8.1. අතුරු ව්‍යවස්ථා අංක 7 හි සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්ට එකී වගන්තියේ (ආ) ව්‍යවස්ථාව අනුව සුදුසුකම් සපුරන ප්‍රදේශයට අදාල ප්‍රාදේශික කාරක සභාවේ ලේකම් වෙත ඉල්ලුම් පත්‍රයක් පිටපත් දෙකකින් ඉදිරිපත් කිරීමෙන් සාමාජිකත්වයට අයදුම් කල හැකිය. එය නියමිත ආකෘති පත්‍රයෙහි එවිය යුතුය. එය ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතුය.

8.2 එම ප්‍රාදේශික කාරක සභාවේ ලේකම් තැන විසින් එකී අයදුම්පත පරීක්ෂා කර අඩුපාඩු වේ නම් සම්පූර්ණ කරවා ගෙන පවත්වන ආසන්නතම කාරක සභා රැස්වීම වෙත ඉදිරිපත් කල යුතුය. එකී කාරක සභාව විසින් අනුමැතිය ලබා දුන් පසු එම අයදුම්කරුගේ නම ප්‍රාදේශික කාරක සභා සාමාජික නාම ලේඛණයට ඇතුළත් කල යුතුය. එහෙත් එම නම ඇතුළත් කිරීමට පෙර 8.3 හා 8.4 වගන්ති ප්‍රකාරව කොටස් මුදල් අයකර ගැනීම ආරම්භ කළ යුතු වන්නේය.

8.3 ප්‍රාදේශික කාරක සභාවේ අනුමැතිය ලද පසු කොටස් මුදල් ගෙවීම සඳහා අයදුම්කරු දැනුවත් කල යුතු අතර කොටස් මුදල් ගෙවිය යුත්තේ අදාල ප්‍රාදේශික කාරක සභාවට අදාල ව්‍යාපාර ඒකකයේ කළමණාකරු වෙත හෝ

ක්‍රියාකාරී ව්‍යාපාර ඒකකයක් නොමැත්තේ නම් සමිතියේ මුදල් අයකැමි වෙතය.

8.4 අවම වශයෙන් රුපියල් පන්සියයක (රු.500.00) වන එක් කොටසක වටිනාකමට අදාල කොටස් මුදල එකවර හෝ රුපියල් පනහක (රු.50.00) අවම මූලික ගෙවීමකින් ආරම්භ කර මූලික ගෙවීමේ දින සිට එක් වර්ෂයක කාලයක් තුළ සම්පූර්ණ කල යුතුය.

8.5 අනුමැතිය ලැබීමෙන් පසු සාමාජික අංකය සටහන් කරන ලද එක් අයදුම්පත්‍රයක් සමිතියේ ලේකම් වෙත යොමු කල යුතු අතර අනෙක් අයදුම්පත විධිමත් පරිදි ගොනුකර ප්‍රාදේශික කාරක සභාවේ ලේකම් භාරයේ තිබිය යුතුය.

8.6 සාමාජිකත්වයට ඉල්ලුම් කරන ඒ සඳහා සුදුසුකම් නැති ඕනෑම අයෙකුගේ නම සාමාජිකයෙකු ලෙස ඇතුලත් නොකිරීමේ බලය ප්‍රාදේශික කාරක සභාවට හිමිය. යම්කිසි ප්‍රාදේශිකයක කාරක සභාවක් විසින් සාමාජිකත්වය ලබා දීම ප්‍රතික්ෂේප කල අවස්ථාවක එම පුද්ගලයාට එකී කාරක සභාවේ තීරණයට විරුද්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ආයාචනයක් ඉදිරිපත් කළ හැකි වේ. ඒ කාරක සභාවේ තීරණය ස්ථිර කිරීමට හෝ වෙනස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත.

8.7 සමිතියේ සාමාජිකත්වය සඳහා යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ද ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඒ තැනැත්තාට රෙජිස්ට්‍රාර් වෙත අභියාචනය කල හැකිය. ඒ අභියාචනය සම්බන්ධව දින හැටක් තුළ ලබා දෙන රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

8.8 යම්කිසි ප්‍රාදේශිකයක් වෙනුවෙන් ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත්කරන තුරු සාමාජිකත්වය සඳහා ඒ ප්‍රාදේශිකයට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත්කරන ඕනෑම ඉල්ලුම්කරුවෙකුගේ සාමාජිකත්වයට ඇතුළත් කිරීම හෝ අවලංගු කිරීමේ බලය තාවකාලිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත.

## 9. ප්‍රාදේශික හා ප්‍රාදේශික කාර්යාල

9.1 සමිතියේ මහා සභාව විසින් ප්‍රාදේශික මහ සභා රැස්වීම් පැවැත්වීමටත්, ප්‍රාදේශික කාරක සභා තෝරා පත් කිරීමටත් ප්‍රදේශ හැකි පමණ ඉක්මණින් වෙන් කල යුතු වන්නේය. එහෙත් මෙම අතුරු ව්‍යවස්ථාව අනුමත කරන දිනට දැනට පවතින ප්‍රාදේශික සඳහා වන ප්‍රදේශ වෙන් කිරීම භාවිත කල හැකිය. වෙන් කරන ලද එකී ප්‍රදේශ නාම ලේඛණය **දෙවන උපලේඛණයට** ඇතුළත් විය යුත්තේය. එකී ප්‍රදේශ වෙන් කරන ලද සිතියමක් මෙම අතුරු ව්‍යවස්ථාවට **තුන්වන උපලේඛණය** ලෙස යා කර තිබිය යුතුය.

9.2 සමිතියේ මහා සභාව විසින් එක් එක් ප්‍රාදේශිකය සඳහා සාමාජිකත්ව බල ප්‍රදේශය වෙන් කර දිය යුතු අතර , විටින් විට අවශ්‍ය පරිදි එසේ වෙන් කර දුන් ප්‍රාදේශික බල ප්‍රදේශ සංශෝධනය කිරීමට මහා සභාවට හැකිය. එකී සංශෝධනයන් විධිමත් පරිදි අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් සිදු කල යුතු ය.

9.3 සමිතියේ එක එක ප්‍රාදේශික සඳහා එක එක කාර්යාලයක් තිබිය යුතු වන්නේය. ඊට සමිතියේ ප්‍රාදේශික කාර්යාලයක් යැයි නම් කරනු ලැබේ.

9.4 ඒ එක එක ප්‍රදේශය සඳහා ප්‍රාදේශික සාමාජික නාම ලේඛණයක් විවෘත කර පවත්වාගෙන යා යුතු වන්නේය. එක ප්‍රාදේශික සාමාජික නාම ලේඛණයේ නම් සඳහන් වී තිබෙන සාමාජිකයන් සමිතියේ එම ප්‍රාදේශිකයේ සාමාජිකයන් වන්නේය.

9.5 සමිතියේ යම් ප්‍රාදේශිකයක සාමාජික සංඛ්‍යාව 200 අඩු වන අවස්ථාවක එම ප්‍රාදේශිකයේ බල ප්‍රදේශය සමඟ ආසන්න බල ප්‍රදේශයේ ප්‍රාදේශිකයට ඒකාබද්ධ කල යුතුය. එවැනි අවස්ථාවක එම ප්‍රාදේශිකයට අදාල සාමාජික නාම ලේඛණය ඒකාබද්ධ කල ප්‍රාදේශිකයේ කාරක සභාවට භාර දිය යුතු අතර එම ප්‍රාදේශිකයේ සාමාජික නාම ලේඛණයේ කොටසක් ලෙස පවත්වාගෙන යා යුතුය. මෙම ඒකාබද්ධ කිරීම තුළින් සාමාජිකයාගේ අයිතිවාසිකම් හා වගකීම් ඇතුළු අඛණ්ඩ පැවැත්මට බාධාවක් නොවිය යුතුය.

9.6 කෙසේ වුවද මෙම ප්‍රාදේශික ඒකාබද්ධ කිරීම සමිතියේ ප්‍රාදේශික කාරක සභා නිල කාලය ආරම්භ වී වසර දෙකක් අවසන් වූ පසු සිදු කල නොහැක්කේය.

## 10. සාමාජික නාම ලේඛනය

10.1 සාමාජික නාම ලේඛණය සඳහා ඒක් ඒක් ප්‍රාදේශිකය වෙනුවෙන් වෙන් කරන ලද සාමාජික අංක භාවිතා කල යුතු අතර එය හතරවන උපලේඛණයේ සඳහන් පරිදි කේත සහිතව සඳහන් කල යුතුය. **(උදා - G-AK-02-235 පද පිළිවෙළ දිස්ත්‍රික් කේතය -සමිති කේතය - ප්‍රාදේශික අංකය - සාමාජික අයදුම්පත් අනුක්‍රමික අංකය)**

10.2 මෙතෙක් සමිතියේ සාමාජිකත්වය ලබා සිටින තැනැත්තන්ගේ සාමාජික අංකය වෙනස් නොකළ යුතු අතර ඉහත 10.1 පරිදි සාමාජික අංක ගලපා ගත යුතුය.

10.3 සමිතියේ යම් ප්‍රාදේශිකයක සාමාජික ලේඛනයෙහි සාමාජිකයෙකු ලෙස නම ඇතුළත් වී ඇති කෙනෙකුට 10.4 වගන්තියේ සඳහන් ආකාරයට හැර සමිතියේ වෙනත් ප්‍රාදේශිකයක නාම ලේඛනයෙහි තම නම සාමාජිකයෙකු ලෙස ඇතුළත් කර ගැනීමට බලය නැත. එහෙත් ඔහුට ඕනෑම ප්‍රාදේශිකයක් මඟින් සමිතියේ සේවාවන් ලබා ගැනීමට බාධාවක් නැත.

10.4 සාමාජිකත්වය ප්‍රාදේශික අතර මාරු කිරීම

I. සාමාජිකයකුට තමා සාමාජිකත්වය ලද ප්‍රාදේශික බල ප්‍රදේශයට අදාලව මෙම අතුරු ව්‍යවස්ථාවේ 8.1 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි එම ප්‍රාදේශිකයේ සාමාජිකත්වය ලබා ගන්නා අවස්ථාවේ වූ සුදුසුකම් වෙනත් ප්‍රාදේශික බල ප්‍රදේශයකට අදාල වන විට පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉල්ලීමක් කිරීමෙන් පසු තම සාමාජිකත්වයට අදාල ප්‍රාදේශිකයට මාරු කල හැකිය.

II. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාදේශික මාරු කිරීමට අදාලව යම් සාමාජිකයකුගේ ඉල්ලීමක් ලද විට එම සාමාජිකයා සාමාජිකත්වය ලබා සිටින ප්‍රාදේශික යේ කාරක සභාවේ හා සාමාජිකත්වය මාරු කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රාදේශිකයේ කාරක සභාවන්හි මතය ද අවධානයට ගෙන ඒ සඳහා අනුමැතිය ලබා දිය යුතුය.

III. එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සාමාජිකත්වය ලබා සිටින ප්‍රාදේශිකයේ කාරක සභාවේ ලේකම් වෙත සමිතියේ ලේකම් විසින් යොමු කල

යුතුය. එම තීරණය ලද පසු පැවැත්වෙන ඊලඟ කාරක සභා රැස්වීමේ දී සාමාජිකත්වය ලබා සිටින ප්‍රාදේශිකයේ නාම ලේඛණයෙන් එම සාමාජිකයාගේ නම ඉවත් කිරීමට කටයුතු කල යුතුය. නාම ලේඛණයෙන් නම ඉවත් කර ඊට අදාල කාරක සභා තීරණය සාමාජිකත්වය ලබා සිටින ප්‍රාදේශිකයේ කාරක සභාවේ ලේකම් විසින් සමිතියේ ලේකම් වෙත විධිමත්ව භාරදිය යුතුය.

IV. නම ඉවත් කිරීමෙන් පසු එම කාරක සභාව විසින් සමිතියේ ලේකම් වෙත යොමු කල අදාල සාමාජික අයදුම්පතෙහි සහතික කල පිටපතක් සාමාජිකත්වය ඇතුළත් කල යුතු නව සාමාජිකත්වය ලබා සිටින ප්‍රාදේශිකයේ කාරක සභාව වෙත විධිමත්ව භාර කළ යුතුය. ඉන් පසු එම සාමාජිකයාගේ තොරතුරු සාමාජිකත්වය මාරු කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රාදේශිකයේ නාම ලේඛණයට නම ඇතුළත් කර සාමාජිකත්වය ලබා දීමට කටයුතු කල යුතුය.

V. එහෙත් එම සාමාජිකයාගේ සාමාජික අංකයේ කිසිදු වෙනස් නොවිය යුතුය. සාමාජිකත්වය මාරු කිරීම පැහැදිලිව හඳුනා ගැනීමට හැකිවන බැවින් එම සාමාජික අංකයේ කේත, ප්‍රාදේශික අංකය ආදී කිසිවක් වෙනස් නොකල යුතුය.

VI. මෙම ප්‍රාදේශික මාරු කිරීම විධිමත්ව සිදු වී ඇති අවස්ථාවක එය සාමාජිකයාගේ අයිතිවාසිකම් හා වගකීම් ඇතුළු අඛණ්ඩ පැවැත්මට බාධාවක් නොවිය යුතුය.

VII. එහෙත් මෙම ප්‍රාදේශික මාරු කිරීම යම් ප්‍රාදේශිකයක ප්‍රාදේශික කාරක සභා නිල කාලය ආරම්භ වී වසර දෙකක් තුළ පමණක් මෙම ප්‍රාදේශික අතර සාමාජිකත්වය මාරු කිරීම සිදු කල යුතු ය.

## 11. පූර්ණ සාමාජිකත්වය

11.1 සමිතියේ පූර්ණ සාමාජිකත්වය පහත කරුණු ද්විත්වය සම්පූර්ණ වන දිනයෙන් ආරම්භ විය යුතුය.

I. සමිතියේ සාමාජිකත්වය ලබා වසරක් සම්පූර්ණ වීම
II. සමිතියේ එක් කොටසකවත් වටිනාකම ගෙවීම සම්පූර්ණ කිරීම

## 12. ආශ්‍රිත සාමාජිකත්වය

12.1 සමිතියේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සමිතියේ ව්‍යාපාරික කටයුතු වලට වාසිදායක වන ගිවිසුමකට එළඹෙන කවර හෝ පුද්ගලයකු ආශ්‍රිත සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත හැකිය.

12.2 ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ වත්කම්වල හෝ ලාභවල කවර ආකාරයේ වූ හෝ කොටසකට හිමිකම් නොලබන අතර සමිතියේ කටයුතු කරගෙන යාමෙහි ලා යම් ඡන්ද බලයකට හිමිකම් ද නොලබයි.

12.3 ආශ්‍රිත සාමාජිකත්වය ලබා දීමේදී

I. ආශ්‍රිත සාමාජිකත්වය අපේක්ෂා කරන පුද්ගලයෙකු සමිතිය විසින් හඳුන්වාදෙන අයදුම්පතකින් ආශ්‍රිත සාමාජිකත්වය ඉල්ලා සිටිය යුතුය.

II. එම අයදුම්පත ඉදිරිපත් කරන්නා නෛතික පුද්ගලභාවයක් ඇති ආයතනයක් හෝ සමුපකාර සමිතියක් වන විට එහි නිල මුද්‍රාව තබා බලයලත් අයවළුන්

විසින් අත්සන් කර තිබිය යුතු අතර ඒ සමඟ එම ආයතනයේ හෝ සමූපකාර සමිතියේ කළමණාකරණ මණ්ඩලය/අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා ගත් විධිමත් තීරණයක් ද යොමු කල යුතුය.

III. එම ඉල්ලුම්පත පරික්ෂා කර සෑහීමකට පත් වීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලයට අයදුම්කරු වෙත ආශ්‍රිත සාමාජිකත්වය ලබා දීමේ බලය ඇත.

IV. ආශ්‍රිත සාමාජිකත්වය ලබා දීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ඇතුළත්වීමේ ගාස්තුවක් ද, එම ගාස්තුවට අමතරව ආපසු නොගෙවන වාර්ෂික දායක මුදලක් අයකිරීමට ද හැකි වන්නේය.

V. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සමිතියට වාසිදායක වන ගිවිසුමකට එළඹීම කල යුතු වේ.

12.4 ආශ්‍රිත සාමාජිකත්වය ලබා දීමේදී ඒ සඳහා සමිතියේ ලේකම් භාරයේ නඩත්තු වන ආශ්‍රිත සාමාජික නාමලේඛණයක් තිබිය යුතුය.

12.5 එම නාම ලේඛණයට ආශ්‍රිත සාමාජිකයාගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, ස්ත්‍රී පුරුෂ භාවය, සාමාජිකත්වයට ඇතුළත් කල දිනය, සාමාජිකත්වය නැති කල/නැති වූ දිනය, දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළත් විය යුතුය. එකී සාමාජිකයා ආයතනයක් වන අවස්ථාවක ලියාපදිංචි අංකය, ලියාපදිංචි නම,ලිපිනය, දුරකථන අංකය, බලයලත් අයගේ නම් හා තනතුරත් දුරකථන අංක හා ලිපිනයත් ඇතුළත් විය යුතුය.

## 13. සාමාජිකයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්

මේ අතුරු ව්‍යවස්ථාවලද එවකට වළංගු සමූපකාර සමිති පිළිබඳ නීතියේ ද සඳහන් සාමාජික අයිතිවාසිකම් යුතුකම් හා වගකීම් සියළුම සාමාජිකයන්ට ඇත. එහෙත් 11 වන අතුරු ව්‍යවස්ථාව පරිදි පූර්ණ සාමාජිකත්වය නොලද සාමාජිකයෙකුට කිසිම ප්‍රාදේශික මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය පාවිච්චි කිරීමේ හෝ බලයත්, යම්කිසි ප්‍රාදේශික කාරක සභාවකට හෝ සමිතියේ මහා සභාවට හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ තෝරා පත්වීමේ බලයත් ඇති නොවන්නේය.

## 14. සාමාජිකත්වයෙන් නෙරපීම

14.1 යම්කිසි සාමාජිකයෙකු මේ අතුරු ව්‍යවස්ථා කඩ කළහොත් අධ්‍යක්ෂ මණ්ඩලයට ඔහු ගැන පැමිණිලි නොකිරීමට හේතු දින 14 ක් ඇතුළත දන්වා එවන ලෙස ඔහුට කියා සිටීමට ඔහු සාමාජිකත්වය ලබා ඇති ප්‍රාදේශික කාරක සභාවට බලය ඇති වන්නේය.

14.2 සාමාජිකයා විසින් හේතු ඉදිරිපත් නොකල අවස්ථාවකදී හෝ ප්‍රාදේශික කාරක සභාවේ අදහස පරිදි ඒ ඉදිරිපත් කර තිබෙන හේතු ප්‍රමාණවත් නොවේ නම් ඒ

සාමාජිකයා ගැනත්, ඔහු නිදහසට කරුණු ඉදිරිපත් කර තිබේ නම් ඒවා ගැනත්, එම ප්‍රාදේශික කාරක සභාව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතු වන්නේය.ඒ නිදහසට කරුණු සතුටුදායක නොවන බැව් තමන් සලකන්නේ මක්නිසාද යන්නද ඒ සමඟම වාර්තා කළ යුතු වේ.

14.3 එවිට අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණයක් පවත්වා සමිතියේ ඊළඟ මහා සභා රැස්වීමේ සැළකිල්ලට භාජනය කිරීම සඳහා ඒ කරුණු ඉදිරිපත් කළ යුතුය.

14.4 එම මහා සභා රැස්වීමට එවිට ඒ සභා රැස්වීමට පැමිණ ඡන්දය දීමට බලය ඇති නියෝජිතයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකොටසකගේ වැඩි ඡන්ද ගණන අනුව ඒ සාමාජිකයා නෙරපා දැමීමට සමිතියේ මහා සභාවට බලය ඇති වන්නේය.

14.5 කෙසේ නමුත් අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධව මෙහි 61 වන අතුරු ව්‍යවස්ථාවේ පනවා ඇති විධිවිධානයන් ද අදාල වේ.

## 15. සාමාජිකත්වය නැතිවීම

පහත සඳහන් කරුණු හෝ කරුණක් හෝ නිසා සාමාජිකත්වය නැති වන්නේය.

(අ) සාමාජිකයාගේ මරණය;

(ආ) සාමාජිකයාගේ සිහි විකල වූ බව නීත්‍යානුකූලව පිළිගෙන තිබීම;

(ඇ) තමාගෙන් සමිතියට අයවිය යුතු ණයක් නොමැතිනම් හෝ සමිතියට අයවිය වීමට තිබෙන ණයකට තමා ඇපකරුවකු නොවේනම් හෝ ලේකම් තැනට මසකට කලින් ලියවිල්ලකින් දැනුම් දී සමිතියෙන් ඉල්ලා අස්වීම;

(ඈ) සාමාජිකත්වය ලබා වසරක් තුළ යටත් පිරිසෙයින් එක කොටසකවත් අයිතිය නොමැතිවීම;

(ඉ) සාමාජිකත්වය සඳහා නියමිත සුදුසුකම් සමාජිකත්වය ලබන අවස්ථාවේ නොමැති වීම අණාවරණය වීම හෝ සමාජිකත්වය ලබා ගැනීමෙන් පසු එකී සුදුසකම් නොමැති බව තහවුරු වීම හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කිරීම;

(ඊ) සාමාජිකත්වයෙන් නෙරපා දැමීම;

## 16. නම් කිරීම

16.1 සෑම සාමාජිකයෙකු විසින්ම තමාගේ මරණින් පසු තමාගේ කොටස හෝ වෙනයම් අයිතියක් සතුවිය යුතු කෙනෙක් නම් කළ යුතු වන්නේය. එක කොටසකට වැඩි ගණනක් අයිති වුවහොත් මිස සාමාජිකයෙකුට එක් කෙනෙකුට වැඩි ගණනක් නම් කළ නොහැකි වන්නේය.

16.2 යම් කිසි සාමාජිකයෙකු විසින් එක් කෙනෙකුට වැඩි ගණනක් නම් කළ හොත් ඒ එක් එක් තැනැත්තාට පැවරිය යුතු කොටස් ගණන හෝ කොටස් වලින් නියමිත ප්‍රමාණය හෝ ඒ සාමාජිකයාගේ වෙනත් සම්බන්ධතාවයක් සමිතියේ තිබේ නම් එය ඒ එක එක තැනැත්තා අතර බෙදා දිය යුතු ආකාරයද ඒ නම් කරන අවස්ථාවේදීම සඳහන් කල යුතුය . තමාගේ කොටස් හා වෙනත් අයිතියක් ඒ නම් කරන ලද අය අතර කුමන අනුපාතයකට බෙදාහැරිය යුතු දැයි සඳහන් කළ යුතු වන්නේය.

16.3 කලින් නම් කරන ලද කෙනෙකුගේ නාමය වෙනස් කර ඒ වෙනුවට වෙන කෙනෙකු නම් කිරීමට සාමාජිකයෙකුට බලය තිබේ. සෑම නම් කිරීමක්ම ලියවිල්ලකින් කළයුතු වේ. එය සහතික කරනු ලබන සාක්ෂි කරුවන් දෙදෙනෙකු ඉදිරිපිට සාමාජිකයා විසින් අත්සන් කළ යුතුය.

16.4 ඒ සියළුම නම් කිරීම් ලේඛනගත කර තැබිය යුතු වේ. නම් කරන ලද සෑම දෙනාගේම සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජික නාම ලේඛනයේ ද සටහන් කළ යුතුය.

16.5 සාමාජිකයෙකු මිය ගිය විට ආසන්නපසුගිය මුදල් වර්ෂය අවසානයේදී තිබූ තත්ත්වය අනුව ඔහුගේ කොටස්වල වටිනාකම තක්සේරු කර ඔහුගෙන් සමිතියට අයකර ගත යුතුව තිබෙන මුදලක් වෙතොත් එය අයකරගෙන ඉතිරි මුදල ඔහු විසින් නම් කරන ලද තැනැත්තාට හෝ තැනැත්තන්ට එම සාමාජිකයාගේ මරණයෙන් වර්ෂයක් ඇතුළත ගෙවිය යුතුවේ.

16.6 එසේ නැතහොත් නම් කරන ලද තැනැත්තා හෝ තැනැත්තන් සාමාජිකත්වය අපේක්ෂා කරන්නේ නම් ඔහු හත්වෙනි අතුරු ව්‍යවස්ථාව අනුව සුදුස්සෙකු වුවහොත් ඔහු අටවෙනි අතුරු ව්‍යවස්ථාව අනුව සාමාජික සංඛ්‍යාවට ඇතුළත් කරගෙන ඉහත සඳහන් ගෙවීම වෙනුවට ඔහුට කොටස් පවරාදිය හැකි වන්නේය.

16.7 මෙම නම්කල තැනැත්තා යන්නට නම්කල තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල තැනැත්තා යන්න අදාල වේ.

## 17. සාමාජිකයින්ගේ වගකීම

17.1 සමිතියේ ණය සඳහා සාමාජිකයින්ගේ වගකීම, ඔවුන් විසින් මිලට ගෙන ඇති කොටස් වටිනාකමට සීමාවේ.

17.2 එහෙත් සමිතියේ ණය සඳහා හිටපු සාමාජිකයෙකුගේ වගකීම සාමාජිකත්වය අවසාන වූ දිනයේ සිට වර්ෂ දෙකක් ගතවනතුරු බලපවත්වයි. එහෙත් එවැනි සාමාජිකයෙකු වගකිවයුතු වන්නේ ඔහුගේ සාමාජිකත්වය අවසාන වන දින දී සමිතිය වගකිවයුතුව තිබූ ණයටය.

17.3 තවද, නැසීගිය සාමාජිකයෙකුගේ බූදලය ඔහු නැසීගිය දින සිට දෙවර්ෂයක් ඇතුළත සමිතියේ ණය සඳහා වගකීමට යටත් වේ. නමුත් එසේ වගකීමට යටත් වන්නේ ඔහු නැසීගිය දිනදී සමිතිය වගකිව යුතුව තිබුණ ණයටය.

## 18. හිලවු කිරීම

සාමාජිකයෙකුට හෝ හිටපු සාමාජිකයෙකුට හෝ නැසීගිය සාමාජිකයෙකු නම් කරන ලද තැනැත්තෙකුට හෝ සමිතියෙන් යම් මුදලක් ගෙවිය යුතුව තිබේ නම් එය එකී සාමාජිකයාගෙන් හෝ හිටපු සාමාජිකයාගෙන් හෝ නැසීගිය සාමාජිකයාගේ බූදලයෙන් හෝ සමිතියට අයවිය යුතුව තිබෙන මුදලක් පිණිස හිලවු කර ගැනීමට සමිතියට බලය ඇති වන්නේය.

## 3 කොටස
## අරමුදල්

**19.** **ප්‍රාග්ධනය**

සමිතියේ ප්‍රාග්ධනය පහත සඳහන් මුදල් වලින් සමන්විත වේ. එනම් :-

I. සාමාජිකයන්ට කොටස් විකිණීමෙන් ලැබෙන මුදල්;

II. ආශ්‍රිත සාමාජිකයන්ගේ ඇතුළත් වීමේ ගාස්තු හා දායක මුදල්;

III. සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් රැස් කරන තැන්පත් මුදල්;

IV. බැංකු හා වෙනත් ආයතනවලින් ණයට ගත් මුදල්;

V. ව්‍යාපාර කටයුතු මඟින් ලැබෙන ලාභ;

VI. නෛතික ප්‍රතිපාදනයන්ට අනුගතව වෙනයම් අයුරකින් ලැබුණු හෝ ලබාගත් හෝ මුදල්;

**20.** **කොටස්**

20.1 මෙම අතුරු ව්‍යවස්ථා මාලාවේ 7 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයෙකුට 8 වෙනි අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි රු.500/= ක මුදලක් එකවර ගෙවීමෙන් හෝ යම් කොටසක් මිලට ගැනීම සඳහා ගෙවීම රුපියල් 50/= ක අවම මූලික ගෙවීමකින් ආරම්භ කර ඒ මූලික ගෙවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුලත කොටසක වටිනාකම වන රුපියල් 500/= ක් දක්වා සම්පූර්ණ කිරීමෙන් සමිතියේ කොටස් ලබාගත හැකි වේ.

20.2 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට පෙර සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයන් මෙම සංශෝධනයට පෙර පැවති කොටසක වටිනාකම සම්පූර්ණ කර තිබීම ප්‍රමාණවත් ය.

20.3 කෙසේ නමුත් 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට පසු එහෙත් මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මක දින දක්වා සාමාජිකත්වය ලැබූ අය සඳහා කොටසක වටිනාකම රු. 500.00 වන්නේ ය. එම මුදල සාමාජිකත්වය අනුමත වූ දින සිට වසරක් තුළ ගෙවා කොටසක අයිතිය ලබා ගත යුතු ය.

20.4 සමිතියේ කොටස් ගණන සීමා කල නොහැකිය.

20.5 සෑම සාමාජිකයෙක්ම අඩු වශයෙන් එක් කොටසක්වත් අයිතිකර ගත යුතුය. එහෙත් සාමාජිකයෙකු විසින් අයිතිකර ගත හැකි කොටස් ප්‍රමාණය විටින් විට මහා සභාව විසින් නියම කල හැකි විය යුතු වන්නේය.

20.6 සමිතියේ සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් පහෙන් පංගුවකට වඩා එක සාමාජිකයෙකුට අයිති කර ගැනීමට බලයක් නැත. මෙම අතුරු ව්‍යවස්ථාවෙන් නියම උපරිම ප්‍රමාණයට වඩා කොටස් ප්‍රමාණයක් යම් විධියකින් එක සාමාජිකයෙකුට හිමි වුවහොත් ඒ වැඩිපුර ඇති කොටස් ප්‍රමාණය ඔහු වෙනුවෙන් විකුණා එයින් ලැබෙන මුදල් ඔහුට භාර දීමට හෝ ඒවායේ

ප්‍රකාශිත අගයට වැඩි නොවන මිලක් ගෙවා ඒවා සමිතියට පවරා ගැනීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට බලය තිබේ.

20.7 කොටස් වෙනුවෙන් ගෙවන මුදල් ආපසු ලබා ගැනීමට සාමාජිකයින්ට බලයක් නැත. එහෙත් පසුගිය මුදල් වර්ෂයේ සාමාජිකත්වය අවසන් වූ සාමාජිකයෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ අභිමතය පරිදි කොටස් පැවරීමේ අරමුදලින් එම සාමාජිකයාට අයිති කොටස් වල ප්‍රකාශිත අගයට වැඩි නොවන මිලක් ගෙවිය හැකි වන්නේය. සමිතියේ මුදල් තත්ත්වය ගැන සලකා බලා කොටස් මුදල් ආපසු ගෙවීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කල හැකි වන්නේය.

20.8 මිය ගිය සාමාජිකයෙකුට හිමි කොටස් මුදලේ ප්‍රකාශිත අගයට නොවැඩි මුදලක් කොටස් පැවරීමේ අරමුදලින් එම මියගිය සාමාජිකයාගේ නම්කල තැනැත්තන්ට, උරුමක්කරුවන්ට හෝ නීත්‍යානුකූල නියෝජිතයන්ට අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවීමට හැකි වන්නේය. එසේ නැතහොත් එම උරුමකරුවන් සාමාජිකත්වය ඉල්ලුම් කර සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව සුදුසුකම් ලබා තිබෙන්නේ නම් ඔහුට අන් තැනක සඳහන් අතුරු ව්‍යවස්ථා නියමයන් පරිදි සාමාජිකත්වයට ඇතුලත් කර එම කොටස් ඔහුට පැවරිය හැකි වන්නේය.

20.9 සාමාජිකත්වයට සුදුසුකම් ලබා ඇති හෝ ඉල්ලුම් කර ඇති සාමාජිකයෙකුට හෝ යම් අයෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතුව කොටස් පැවරිය හැකි වන්නේය. එහෙත් එම කොටස් පැවරීම සිදු විය යුත්තේ 8 වන අතුරු ව්‍යවස්ථාව පරිදි සාමාජිකත්වය අනුමත කර කොටස් මුදල් ගෙවිය යුතු අවස්ථාවේදී ය.

20.10 එවැනි තැනැත්තකු සාමාජිකත්වයට ඇතුළත් කර ගත් විට නව සාමාජික අංකයක් නිකුත් කල යුතු අතර සාමාජිකත්වය ලබා වසරකින් පසු පූර්ණ සාමාජිකත්වය හිමි වේ.

## 21. කොටස් පැවරීමේ අරමුදල

20.1 ව්‍යවස්ථාපිත විගණනයකින් පසු සමිතියේ ශුද්ධ ලාභය ව්‍යවස්ථාපිත සංචිතයකට හා සමුපකාර අරමුදලට විසර්ජනය කිරීමෙන් පසු ඉතිරි ලාභයෙන් සියයට දහයකට නොවැඩි මුදලක් කොටස් පැවරීමේ අරමුදලකට වෙන් කල හැකිය.

20.2 මෙම අරමුදලට මුදල් වෙන් කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉතිරි ලාභ බෙදීමේ ක්‍රියාවලියට අනුකූල විය යුතුය.

20.3 සාමාජික කොටස් ආපසු ගෙවිය හැක්කේ මෙම අරමුදලින් පමණක් වන්නේය.

## 22. තැන්පත්

22.1 සමිතියේ සාමාජිකයන්ගෙන් හා 23 වන අතුරු ව්‍යවස්ථා වගන්ති වල සඳහන් සීමාවන්ට යටත්ව ආශ්‍රිත සාමාජිකයන්ගෙන් හා සාමාජික නොවන අයගෙන් තැන්පත් මුදල් රැස් කිරීමට සමිතියට බලය ඇත.

22.2 සමිතියේ තැන්පත් කරනු ලබන සියළු මුදල් එකී තැන්පත් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති කොන්දේසි හා විධිවිධානයන්ට යටත් වන්නේය.

22.3 සාමාජිකයන්ගෙන් හා සාමාජික නොවන අයගෙන් අය කරනු ලබන මුදල් සඳහා ගෙවනු ලබන පොළී අනුපාතිකයන් දකුණු පළාත් සමුපකාර කොමසාරිස්වරයාගේ නියමයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

22.4 සාමාජික තැන්පත් හිමි සාමාජිකයකුගේ තැන්පත් සමිතියට හෝ වෙනත් සමුපකාර සමිතියකට හෝ ඇවරකරුවෙකුට ඒ සාමාජිකයාගෙන් අයවිය යුතු ණයකට හෝ වෙනයම් මුදලකට හෝ හිලව් කල හැකිය.

## 23. සමිතියේ උපරිම ණය සීමාව

23.1 සමිතිය විසින් ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජික නොවන්නන්ගෙන් ලබා ගත හැකි උපරිම ප්‍රමාණය සමිතියේ මහ සභා රැස්වීමකදී වරින් වර නියම කර ගත යුතුය.

23.2 එක් වාර්ෂික මහා සභාවකදී අනුමත කරන ලද උපරිම ප්‍රමාණය ඊලඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී සංශෝධන ය කරන තෙක් වලංගු වන්නේය. එහෙත් පවතින සීමාව හෝ වැඩිවන සීමාව සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දීම අනුමත කල යුතු ය.

23.3 එහෙත් එම උපරිම සීමාව නියම කිරීම නිසා සමිතියට දුෂ්කරතාවයක් ඇතිවේයැයි වැටහෙන අවස්ථාවක යම්කිසි කාල පරිච්ජේදයකට එම සමිතියට උපරිම ප්‍රමාණයක් නියම කිරීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ලැබේ.

23.4 එහෙත් තැන්පත් වශයෙන් සාමාජික නොවන්නන්ගෙන් ලබා ගත හැකි උපරිම ප්‍රමාණය සමිතියේ මුලු සාමාජික තැන්පත් වටිනාකම නොඉක්මවිය යුතුය .

**4 කොටස**

**ප්‍රාදේශික මහා සභා රැස්වීම්, කාරක සභා සංස්ථාපනය, කාර්යයන්, රැස්වීම්, පුරප්පාඩු, කාර්යයන්**

## 24. ප්‍රාදේශික මහ සභා රැස්වීම

24.1 යම් කිසි ප්‍රාදේශිකයක සාමාජික නාම ලේඛනයෙහි නම් ලියා පදිංචි කර තිබෙන සාමාජිකයන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක්, අවශ්‍ය වූ කටයුතු කිරීමට ද, විශේෂයෙන්ම පහත සඳහන් කටයුතු කිරීම සඳහා ද පැවැත්විය යුතු වන්නේය.

එනම් :-

(අ) සාමාන්‍යයෙන් සමිතියේ කටයුතුද, විශේෂයෙන්ම ඒ ප්‍රාදේශිකයේ කටයුතුද සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවද, ගණන් පරීක්ෂණයට භාජනය වූ සමිතියේ ගිණුම් ලේඛනයද, ගණන් පරීක්ෂක තැනගේ වාර්තාවද, සලකා බැලීම;

(ආ) එහි කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශික කාරක සභාවේ වාර්තාව සලකා බැලීම;

(ඇ) සමිතියේ වැඩ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම හා යෝජනා ඉදිරිපත් කිරීම;

(ඈ) ක්‍රියාත්මක කළ හැකි සමාජ සේවා, අධ්‍යාපනික, සංස්කෘතික, යහපත් විනෝද කටයුතු පිළිබඳ වැඩ සටහන් ගැන නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඉ) සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ඉදිරිපත් කර තිබෙන කරුණු සළකා බැලීම.

24.2 යම් කිසි ප්‍රාදේශිකයක නම් ලියා පදිංචි කර තිබෙන සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීම් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක පැවැත්විය හැකිය.

24.3 කොමසාරිස්තුමා විසින් හෝ ඒ සඳහා කොමසාරිස්තුමා විසින් බලය පවරන ලද ඕනෑම කෙනෙකු විසින් හෝ සමිතියේ සභාපති තැන විසින් හෝ ප්‍රාදේශික කාරක සභාවේ සභාපති තැන විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශික කාරක සභාව විසින් හෝ ඒ ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකයන්ගෙන් දෙකෙන් කොටසකට වැඩි ගණනක් විසින් හෝ ප්‍රාදේශික මහා සභා රැස්වීමක් කැඳවීම සඳහා ඉල්ලීම් කළ හැකිය.

24.4 24 (3) වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශික මහා සභා රැස්වීමක් කැඳවීමට බලය ඇති ඕනෑම කෙනෙකු විසින් හෝ මණ්ඩලයක් විසින් හෝ එසේ කැඳවන ලෙස ලියවිල්ලකින් දන්වා සිටි විට ඒ ප්‍රාදේශික කාරක සභාවේ ලේකම් තැන ප්‍රාදේශික මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

24.5 සමිතියේ ව්‍යාපාරික කටයුතු වලට අදාළ කරුණක් සාකච්ඡා කිරීම සඳහා යටත් පිරිසෙයින් ඒ ප්‍රාදේශිකයේ සාමාජික නාම ලේඛනයේ නම් ලියාපදිංචි වී ඇති සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් පංගුවක් හෝ 25 දෙනෙකු හෝ යන සංඛ්‍යාවෙන් අඩු ප්‍රමාණය ලියවිල්ලකින් ඉල්ලා සිටි විට ප්‍රාදේශික කාරක සභාව විසින් විශේෂ ප්‍රාදේශික මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

24.6 කොමසාරිස්තුමා විසින් හෝ එතුමාගෙන් ඒ සඳහා බලයලත් තැනැත්තෙකු විසින් හෝ කැඳවන ලද අවස්ථාවකදී හැර අන්‍ය අවස්ථාවලදී ප්‍රාදේශික මහා සභා රැස්වීම ගැන යටත් පිරිසෙයින් දින 7 ක් වත් කල් ඇතිව දැන්වීම පිට කළ යුතුය.

24.7 කොමසාරිස්තුමා හෝ ඒ සඳහා එතුමා විසින් බලයදුන් කෙනෙකු හෝ ප්‍රාදේශික මහා සභා රැස්වීමක් කැඳවීමේ දී යටත් පිරිසෙයින් පැය 24 ක් වත් කල්දිය යුතුය.

24.8 යම්කිසි ප්‍රාදේශික මහා සභා රැස්වීමක් කැඳවීමේ දැන්වීම් පත්‍රයෙහි රැස්වීම පවත්වන දිනය, වේලාව සහ ස්ථානයද එහිදී කෙරෙන වැඩද සඳහන් විය යුතුය.

24.9 ඕනෑම ප්‍රාදේශික මහා සභා රැස්වීමක දී යම්කිසි කටයුත්තක් කිරීමට කොමසාරිස්තුමා හෝ ඒ සඳහා කොමසාරිස්තුමා විසින් බලය දෙන ලද කෙනෙකු විසින් හෝ මහා සභාව කැඳවූ අවස්ථාවලදී හැර අන්‍ය අවස්ථාවලදී ප්‍රාදේශිකයේ සාමාජික නාම ලේඛනයෙහි නම් ලියා පදිංචි කරන ලද සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් හතරෙන් පංගුවක් හෝ 25 දෙනෙකු හෝ යන සංඛ්‍යාවෙන් අඩු සංඛ්‍යාව පැමිණ සිටීම අවශ්‍ය වන්නේය. කොමසාරිස්තුමා හෝ එතුමාගෙන් බලයලත් කෙනෙකු හෝ කැඳවූ රැස්වීමක කටයුතු කිරීමට යටත් පිරිසෙයින් සාමාජිකයින් තුන් දෙනෙකු සිටිය යුතු වේ.

24.10 ප්‍රාදේශික මහා සභා රැස්වීමකට ඉදිරිපත් වන සෑම කරුණක්ම තීන්දු වන්නේ ඒ ගැන කරන ලද යෝජනාවකින්ය. යම් යෝජනාවක් පිළිගත් ලෙස සළකනු ලබන්නේ රැස්වීමට පැමිණ සිටි සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවකට වැඩි ගණනක් යෝජනාවට එකඟව ඡන්දය දුන් විටය.

24.11 ඔහු මිළට ගෙන තිබෙන කොටස් ගණන කොපමණ වෙතත් එක සාමාජිකයෙකුට හිමි වන්නේ එක ඡන්දයක් පමණය. සාමාජිකයෙකු වෙනුවට වෙන කෙනෙකුට ඡන්දය දිය නොහැකිය. පැමිණ සිටින සාමාජිකයන් ගේ කැමැත්ත පරිදි ඡන්දය දීම අත් ඔසොවා පෙන්වීමෙන් හෝ රහස් ඡන්ද ක්‍රමයට හෝ කළ හැකිය. එහෙත් කොමසාරිස්තුමා හෝ ඒ සඳහා කොමසාරිස්තුමා විසින් බලය දෙන ලද කෙනෙකු විසින් හෝ මහා සභාව කැඳවූ අවස්ථාවලදී ඡන්දය දීම රහස් ඡන්ද ක්‍රමයට කළ යුතුය. එහෙත් ඡන්දය දිය යුතු ආකාරය මහා සභාවේ කැමැත්ත විමසීම අපහසු බව පෙනී යන අවස්ථාවක රහස් ඡන්ද ක්‍රමය භාවිත කල හැකිය.

24.12 සභාපති හෝ ඔහු පැමිණ නොසිටියොත් උප සභාපති හෝ ඒ දෙදෙනාම පැමිණ නොසිටියොත් පොදු කැමැත්තෙන් තෝරාපත් වෙන සාමාජිකයෙකු හෝ ප්‍රාදේශික මහා සභා රැස්වීමක මුලසුන ගත යුතුය. මහා සභාව කොමසාරිස්තුමා විසින් කොමසාරිස්තුමාගෙන් බලයලත් කෙනෙකු විසින් හෝ සමිතියේ සභාපති තැන විසින් හෝ කැඳවූ අවස්ථාවේදී කොමසාරිස්තුමාට හෝ එසේ බලය ලත් අයට හෝ සමිතියේ සභාපති තැනට හෝ තමා කැමති නම් මුලසුන ගැනීමට බලය ඇත.

24.13 සෑම ප්‍රාදේශික මහා සභා රැස්වීමකම වාර්තා ප්‍රාදේශික කාර්යාලයෙහි තබන වාර්තා පොතෙහි සටහන් කළයුතු වන්නේය. එහි සහතික කරන ලද පිටපතක් සභාපති හා ලේකම් තැන විසින් අත්සන් කර අධ්‍යක්ෂ මණ්ඩලයට යැවිය යුතුය.

## 25. ප්‍රාදේශික කාරක සභා සංස්ථාපනය

25.1 මෙම අතුරු ව්‍යවස්ථාවලියේ 09 වන අතුරු ව්‍යවස්ථාව මෙසේ පිහිට වූ සෑම ප්‍රාදේශිකයක් සඳහාම ප්‍රාදේශික කාරක සභාවක් සිටිය යුතු වන්නේය.

25.2 ඒ ප්‍රාදේශික නාම ලේඛනයෙහි නම් සඳහන් කල සාමාජිකයින් විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් ඇතුළු නෛතික ප්‍රතිපාදනයන් අනුව තෝරා පත් කරනු ලබන යටත් පිරිසෙයින් (පත් වන අවස්ථාවේදී )වයස අවුරුදු දහ අටත් තිස්පහත් අතර (අවු. 18-35) සාමාජිකයින් දෙදෙනෙකුවත් ඇතුළත් වන සාමාජිකයන් 09 දෙනෙකුගෙන් එම කාරක සභාව සමන්විත විය යුතුය.

25.3 එහෙත් පහත සඳහන් අය ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත් කර ගත නොහැකිය.

I. වයස අවුරුදු 18 ට අඩු කෙනෙක්
II. පසුගිය තුන් වර්ෂය තුළ දුෂ්චරිතය සම්බන්ධ නඩුවකින් වරදකරුවෙකු වූ කෙනෙක් හෝ තුන් මසකට අධික කාලයක් සිර දඩුවමක් ලැබීමට නියම වූ කෙනෙක්,
III. බංකොලොත්කාරයෙකු වීමට ඉල්ලා ඇති කෙනෙක් හෝ බංකොලොත්කාරයෙකු ලෙස උසාවිය විසින් පිළිත් කෙනෙක්,
IV. සිහි විකල වූ කෙනෙක්

V. සමිතියට හෝ වෙනත් ලියාපදිංචි කල සමිතියකට හෝ ඇවර කරුවකුට හෝ ගෙවිය යුතු ණයක් හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම වර්ෂ 06ක් තුල තුන් මසකට අධික කාලයක් පැහැර හැර ඇති කෙනෙක්,හෝ සමිතියට හෝ වෙනත් සමිතිය කටහෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම පැහැර හැර ඇති කෙනෙක්

VI. පසු ගිය වර්ෂ 06ක් තුල පිට පිටම කාරක සභාවට තෝරා පත් වු කෙනෙක්

VII. මහ සභාවේ තිරණය පරිදි සමිතියේ දියුණුවට බාධක යම් වෙළදාමක හෝ වෙනත් කටයුත්තක තමන්ගේම හෝ අන් අයකුගේ මාර්ගයෙන් හෝ යෙදි සිටින කෙනෙක්

VIII. වෙළෙන්දෙකු වශයෙන් සමිතියේ ලියාපදිංචි වී සිටින කෙනෙක් හෝ සමිතියේ දියුණුවට බාධා වන යම් ව්‍යාපාරයක යෙදී සිටින කෙනෙක්,

IX. සමිතියෙන් ආදායමක් හෝ ලාභයක් ලැබෙන නිළයක් හෝ තනතුරක් උසුලක කෙනෙක් හෝ කොමසාරිස්තුමාගේ පූර්ව අනුමැකිය නොමැතිව සමිතියෙන් පාරිතෝෂික මුදලක් ලබන කෙනෙක්,

X. මේ සමිතියේ හෝ මේ සමිතිය සාමාජිකත්වය දරණ වෙනත් සමිතියක හෝ වැටුප් ලබන සේවකයෙක්,

XI. සමිතිය සමග ඇති කර ගන්නා ලද ගිවිසුමක් හෝ සමිතියේ යම් විකිණීමක් හෝ මිළට ගැනීමක් හෝ සමිතියේ මුදල් සම්බන්ධයෙන් එවකට ඇති කරගෙන තිබෙන්නාවූද , ඇති කර ගැනීමට විධි විධාන සලස්වාගෙන යන්නා වූද ගිවිසුමක් හෝ ගනුදෙනුවක් හෝ පිලිබඳව සාමාජිකයෙකු වශයෙන් හැර තමන්ගේම හෝ අන්කිසි අයෙකුගේ මාර්ගයෙන් හෝ සම්බන්ධයක් ඇති කෙනෙක්,

XII. සමුපකාර සමිති පිළිබද නීතිය යටතේ තම නිළයෙන් හෝ සේවයෙන් පහ කරනු ලැබු කෙනෙක්,

XIII. සාමාජිකත්වයට ඇතුලත් කර ගැනීම ප්‍රාදේශික කාරක සභාව විසින් සලකා නොලැබු කෙනෙක්,

25.4 කොමසාරිස්තුමා විසින් පනවා රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශ කරනු ලබන නියෝග අනුව, ප්‍රාදේශික කාරක සභා තෝරා පත් කල යුතු වන්නේය. සමිතිය ලියාපදිංචි කල දින සිට හය (06) මසක් ඇතුලත පළමුවෙනි ප්‍රාදේශික කාරක සභාව තෝරා පත් කල යුතු වන්නේය. ඉන්පසු ප්‍රාදේශික කාරක සභා වලට සාමාජිකයින් තෝරා පත් කිරීම වර්ෂ තුනකට වරක් සමිතියේ ප්‍රාදේශික කාරක සභාවේ නිල කාලය ඉකුත් වීමට යටත් පිරිසෙයින් සති හතරකට වත් පෙර කල යුතු වන්නේය.

25.5 ප්‍රාදේශික කාරක සභාවක නිල කාලය වසර තුනකි. නිල කාලය ගණනය කිරීම නාම යෝජනා දිනයෙන් ආරම්භ වන්නේය.

25.6 යම් කිසි ප්‍රාදේශික කාරක සභාවකට නාම යෝජනා පහකට අඩු සංඛ්‍යාවක් ලැබුනහොත් හෝ තෝරා පත් වූ කාරක සභිකයන්ගේ සංඛ්‍යාව යම් අවස්ථාවක පහකට අඩු වුවහොත් හෝ එම ප්‍රාදේශික කාරක සභාවට ඉතිරි කාලය සඳහා සියළුම සභිකයින් නැවත තෝරා පත් කර ගැනීමට හැකිය.

එහෙත් කලින් නාම යෝජනා භාර ගැනීමට නියමිත දින සිට වර්ෂයක් ඉකුත් වන තෙක් නැවත නාම යෝජනා භාර ගැනීම නොකල යුතුය.

25.7 කාරක සභාවට තෝරා පත් කර ගනු ලැබූ අයෙක් තෝරා පත් කිරීමෙන් දින 14 ක් ගත වීමට ප්‍රථම තමා එසේ තෝරා පත් කිරීමට නුසුදුසු නොවන බවට දිව්රුම් ප්‍රකාශ මෙහි අතුරු ව්‍යවස්ථාව යටතේ නුසුදුසුකම් නොමැති බවට පස්වන උපලේඛණයේ සඳහන් ආකෘතියෙන් කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකුට භාර දිය යුතුය.

25.8 තෝරා පත් කර ගැනීමෙන් සහ නම් කිරීමෙන් දින 14 ක් ගත වීමට ප්‍රථම මෙම දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් නොකරන කාරක සභිකයෙකුගේ කාරක සභික තනතුර එම කරුණින්ම අහෝසි වන්නේය.

25.9 එක් එක් ප්‍රාදේශික කාරක සභාව තමන් අතුරින් සභාපති කෙනෙකු ද, උප සභාපති කෙනෙකු ද, ලේකම් කෙනෙකු ද තෝරා පත් කර ගත යුතුවේ. ඒ එක් එක් නිලධාරී තැන මෙහි අතුරු ව්‍යවස්ථා හා නෛතික ප්‍රතිපාදන යටතේ අළුත් ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කරන තුරු හෝ යම් කිසි නුසුදුසුකමක් නිසා හෝ කාරක සභාව විසින් නිලයෙන් අස් කිරීම නිසා හෝ ලේකම් තැනට ලියවිල්ලකින් මසකට කලින් දැනුම් දී තම නිලයෙන් හෝ කාරක සභිකත්වයෙන් ඉල්ලා අස්වීම නිසා හෝ කාරක සභිකත්වය නැතිවන තුරු හෝ ඒ ඒ නිලය දැරිය යුතුය.

25.10 කාරක සභාවට සභිකයන් නිතරඟයෙන් හෝ ජන්ද විමසීමකින් පත් වූ පසු හැකිතාක් ඉක්මනින් පළමු කාරක සභා රැස්වීම පැවැත්විය යුතුය. එහෙත් එම කාල සීමාව දින 14 නොඉක්මවිය යුතුය. එම කාලය තුළ කාරක සභාව රැස් වී නොමැත්තේ නම් සමිතියේ ලේකම් විසින් දින 14 තුළ කාරක සභාව යථා පරිදි රැස් කල යුතුය. මෙම අවස්ථ දෙකෙහිදීම කාරක සභාවට පත් වූ සියළුම කාරක සභිකයන් සහභාගි වී සිටිය යුතුය. එම අවස්ථා කිසිවකින් සමිතියේ කාරක සභාව රැස් කිරීම ව්‍යවර්ථ වූයේ නම් ඒ බව සමිතියේ ලේකම් විසින් සමුපකාර කොමසාරිස් වෙත විධිමත්ව වාර්තා කර නෛතික ප්‍රතිපාදනයන්ට අනුව කාරක සභා රැස්වීම කැඳවීමට පහසුකම් සැලසිය යුතුය.

## 26. ප්‍රාදේශික කාරක සභාවක කාර්යයන්

I. ප්‍රාදේශිකයේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා පරීක්ෂා කාරී මණ්ඩලයක් වශයෙන් ක්‍රියා කිරීම;

II. ප්‍රාදේශිකය සමඟ තම ගනුදෙනු සම්බන්ධයෙන් සාමාජිකයන්ගෙන් ලැබෙන පැමිණිලි භාරගෙන ඒ ගැන පරීක්ෂා කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාදේශික කළමනාකාර තැනට, සාමාන්‍යාධිකාරී තැනට, හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීම.

III. ප්‍රාදේශික කළමනාකාර තැනගේ වැඩ ගැන සොයා බැලීම;

IV. අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාදේශික කළමනාකාර තැනට සාමාන්‍යාධිකාරී තැනට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කිරීම;

V. සාමාජිකයන්ගෙන් ලැබෙන ණය ඉල්ලුම් පත්‍ර ගැන සමිතියේ විධායක නිළධාරීන් විසින් කරුණු විමසූ විට ඒවා ගැන විස්තර සැපයීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම;

VI. අධ්‍යක්ෂ මණ්ඩලය එසේ ඉල්ලා සිටි විට ප්‍රාදේශිකයේ සාමාජිකයන්ගෙන් අයවිය යුතු වූ ණය මුදල් ආපසු ලබා ගැනීම හා වෙනත් කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් සැපයීම හා ආධාර කිරීම;

VII. අධ්‍යක්ෂ මණ්ඩලය හෝ සමිතියේ සාමාන්‍යාධිකාරී තැන හෝ විශේෂයෙන් විමසනු ලබන සියළුම කරුණු සම්බන්ධයෙන් තම අදහස් ප්‍රකාශ කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම;

VIII. සාමාජික අධ්‍යාපනය පිළිබඳ වැඩ පිළිවෙලවල් සකස් කර ක්‍රියාත්මක කරගෙන යෑම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන වෙනත් කටයුතු කිරීම;

IX. සාමාජිකයින් ඇතුළත් කර ගැනීම සලකා බැලීම පිණිස අයදුම්පතක් ලැබී අවම වශයෙන් දින 14 තුළ දී රැස්වීම;

X. මේ අතුරු ව්‍යවස්ථා කඩකරන සාමාජිකයින් ගැන අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම;

XI. සමිතියේ මහා සභාවට නියෝජිතයින් තෝරා පත්කර ගැනීම.

## 27. ප්‍රාදේශික කාරක සභා රැස්වීම්

27.1 ප්‍රාදේශික කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් ද, අනිකුත් අවස්ථාවලදී අවශ්‍ය යැයි සලකන විටද පැවැත්විය යුතුය.

27.2 ප්‍රාදේශික කළමනාකාර තැන තමන්ට ආරාධනා කළවිට ප්‍රාදේශික කාරක සභාවේ සියළුම රැස්වීම්වලට පැමිණ ප්‍රාදේශිකයේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශික කාරක සභාවට අවශ්‍ය වන විස්තර සැපයිය යුතුය.

27.3 ප්‍රාදේශික කාරක සභා රැස්වීම් ප්‍රාදේශික කාරක සභාවේ සභාපති තැනද, ප්‍රාදේශික කාරක සභාවේ සභිකයන්ගෙන් දෙකෙන් කොටසකට වැඩි ගණනක්ද, සමිතියේ සභාපති තැනද, කොමසාරිස්තුමාද, කොමසාරිස් තුමා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කෙනෙක්ද විසින් කැඳවිය හැකිය.

27.4 ප්‍රාදේශික කාරක සභාවක ඕනෑම රැස්වීමක දී කටයුතු කරගෙන යෑමට මෙම අතුරු ව්‍යවස්ථාවේ වෙනත් තැන්හි විශේෂ සඳහනක් නොවන අවස්ථාවක දී හැර යටත් පිරිසෙයින් සාමාජිකයින් 5 දෙනෙකුවත් පැමිණ සිටිය යුතුය. ප්‍රාදේශික කාරක සභාවේ සභාපති තැනට හෝ ඔහු පැමිණ නොසිටියොත් උප සභාපති තැනට හෝ ඒ දෙදෙනාම පැමිණ නොසිටියොත් ඕනෑම කාරක සභිකයෙකුට හෝ ඒ කාරක සභාවේ රැස්වීම් වල මුලසුන දැරිය හැක. එක සාමාජිකයෙකුට ඇති වන්නේ එක ඡන්දයක් පමණකි. ඡන්ද ගණන සමාන වූ විට මුලසුන දරන තැනැත්තාට තීරක ඡන්දයක් ඇත.

27.5 ප්‍රාදේශික කාරක සභා රැස්වීම්වලදී සාකච්ඡා කරන ලද්දා වූද, තීරණය කරන ලද්දාවූද, සියළුම කරුණු වාර්තා පොතක සටහන් කළ යුතු වේ. සභා රැස්වීම

අවසානයේ දී එම රැස්වීමේ සභාපති තැන හා පැමිණ සිටි අනිකුත් සියළුම සාමාජිකයන්ද එයට අත්සන් කළ යුතුය.

27.6 එක එක ප්‍රාදේශික කාරක සභාවේ ලේකම් තැන ඒ ප්‍රාදේශික කාරක සභාවේ සියළුම ලිපි ගණුදෙනු පිළිබඳ කටයුතු කළ යුතුය. ප්‍රාදේශික කාරක සභාවේ සියළුම රැස්වීම් වලටත් ප්‍රාදේශික මහා සභා රැස්වීම් වලටත් ඔහු පැමිණ සිටිය යුතුය. ඒ සියළුම සභා රැස්වීම් වල වාර්තා, ඒ ඒ අදාළ වාර්තා පොත්වල ඔහු විසින් සටහන් කළ යුතුය. ඔහු විසින් ඒ සියළුම වාර්තාවල පිටපත් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට යැවිය යුතු වේ.

**28. ප්‍රාදේශික කාරක සභා පුරප්පාඩු**

28.1 කාරක සභාවේ ඇති වන පුරප්පාඩු ඒ ප්‍රාදේශිකයේ සාමාජික නාම ලේඛනයේ නම් ලියාපදිංචි කර තිබෙන පූර්ණ සාමාජිකයින්ගෙන් පිරවීමට එක එක ප්‍රාදේශික කාරක සභාවට බලය ඇත.

28.2 කෙසේ වෙතත් කිසිම ප්‍රාදේශික කාරක සභාවක් විසින් හෝ ප්‍රාදේශික කාරක සභා රැස්වීමකදී හෝ කරන ලද කටයුත්තක් ඒ ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් හෝ ඒ ප්‍රාදේශික කාරක සභාවේ ඕනෑම සාමාජිකයෙකුගේ පත්වීමේ හෝ තෝරා පත් කිරීමේ හෝ යම් කිසි අඩුලුහුඩු කමක් හෝ ඇති වූ පමණින් අවලංගු නොවේ.

25.3 උක්ත 28.1 අතුරු ව්‍යවස්ථාවේ කෙසේ සඳහන් වුවද තෝරා පත් වූ කාරක සභිකයකු ඉල්ලා අස්වීම මත පුරප්පාඩු වන අවස්ථාවකදී එම ප්‍රාදේශික කාරක සභාව සඳහා සභිකයන් ජන්ද විමසීමකින් තෝරා පත් කර ගෙන තිබේනම්, වසරක් ගතවන තුරු පුරප්පාඩු වූ සභික ධුරයකට ජන්ද විමසීමේ ඊ ලඟට ජන්ද ලබා ඇති අපේක්ෂකයා පත් කල යුතුය. එහෙත් ඔහු පත්වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊලඟ ජන්ද හිමි අපේක්ෂකයා පත් කල හැකි වන්නේ ය. කෙසේ නමුදු පුරප්පාඩු පිරවීමට අපේක්ෂකයන් නොමැති අවස්ථාවක හෝ ප්‍රාදේශික කාරක සභා නිලවරණය පවත්වා වසරක් ගත වී ඇති අවස්ථාවක හෝ ඉල්ලා අස්වීමක් නොවන ඕනෑම අවස්ථාවක 28.1 අතුරු ව්‍යවස්ථාව පරිදි පුරප්පාඩු පිරවිය හැකිය.

25.4 කාරක සභාවේ ඇති වන පුරප්පාඩු පිරවීමේදී 22.2 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සංයුතිය වෙනස් නොවිය යුතුය.

## 4 කොටස
## සමිතියේ මහා සභාව

**29. මහා සභාව සංස්ථාපනය**

29.1 සමිතියේ මහා සභාවක් ඇති විය යුතු වන්නේය. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සහ සමිතියේ නොයෙකුත් ප්‍රාදේශිකයන් නියෝජනය කරන නියෝජිතයින්ගෙන් සමන්විත විය යුතු වන්නේය. එහෙත් ඡන්දය

පාවිච්චි කිරීමට බලය ඇති වන්නේ ප්‍රාදේශික නියෝජනය කරන නියෝජිතයින්ට පමණක් ය.

29.2 ප්‍රාදේශිය කාරක සභාවලට නියෝජිතයින් තෝරා පත් කර ගැනීමෙන් පසු මාස තුනක් ඉකුත් වීමට පෙර මහා සභාවේ පලමුවෙනි රැස්වීම පැවැත්විය යුතුය.

29.3 සෑම මහා සභාවක්ම පළමුවරට රැස්වීම නියම කරන ලද දිනයේ පටන් තුන් අවුරුද්දකට නොවැඩි කාලයක් පවතින්නේය. එකී තුන් අවුරුදු කාලය ඉකුත්ව ගිය විටම මහා සභාව විසිර ගියාසේ සැලකෙන්නේය.

## 30. මහා සභා නියොජිතයෝ

30.1 එක් එක් ප්‍රාදේශිකය විසින් නම් කල හැකි නියෝජිතයින් සංඛ්‍යාව සමිතියේ ලේකම් තැන ප්‍රාදේශිකයේ පියවන ලද සාමාජික නාම ලේඛණය සමඟ එම නාමලේඛණයේ ඇමුණුමක් ලෙස සහතික කර ඉදිරිපත් කල යුතු ය.

30.2 එක එක ප්‍රාදේශිකයෙන් එවිය හැකි නියෝජිතයින්ගේ සංඛ්‍යාව පහත දැක්වෙන ගණිත සූත්‍රය අනුව ගණන් බැලූ විට ලැබෙන කිට්ටුම පූර්ණ සංඛ්‍යාව විය යුතු වන්නේය; එනම්,

$$\frac{\text{ප්‍රාදේශිකයේ සාමාජික සංඛ්‍යාව X 100}}{\text{සමිතියේ සාමාජික සංඛ්‍යාව}}$$

තවද එය පහත සඳහන් කොන්දේසිවලට ද යටත් වන්නේය. එනම්,

(අ) යටත් පිරිසෙයින් එක නියෝජිතයෙකුවත් එවීමට සෑම ප්‍රාදේශිකයකටම බලය ඇති වන්නේය. නමුත් ඒ සඳහා එම ප්‍රාදේශිකයේ සාමාජික සංඛ්‍යාව 200 හෝ ඊට වැඩි විය යුතුය.

(ආ) නියෝජිතයින් නව දෙනෙකුට වැඩි ගණනක් එවීමට කිසිම ප්‍රාදේශිකයකට බලය ඇති නොවන්නේය.

(ඇ) ප්‍රාදේශිකයකින් මහා සභාවට එවන නියෝජිතයන් සංඛ්‍යාව එකකට වඩා වැඩි වන අවස්ථාවක දී අවම වශයෙන් වයස අවුරුදු 18-35 අතර නියෝජිතයින් එක් අයෙකුවත් ඇතුළත් විය යුතු වන්නේ ය.

30.3 මෙහි 27.2 වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි, සමිතියේ ලේකම් තැන විසින් පත් කල හැකි නියෝජිතයින්ගේ සංඛ්‍යාව දැනුම් දුන්පසු, නියමිත නියෝජිතයින් සංඛ්‍යාව තෝරා ගැනීම ප්‍රාදේශික කාරක සභාවේ යුතුකම වන්නේය. එසේ තෝරා පත් කරනු ලබන නියෝජිතයින් සමිතියේ මහා සභාවේ කාලය අවසන් වන තෙක් අදාල ප්‍රාදේශිකයේ සාමාජිකයින් නියෝජනය කල යුතු වෙයි.

30.4 ඉහත සඳහන් පරිදි තෝරා පත් කරනු ලබන සෑම නියොජිතයෙකුටම ප්‍රාදේශික කාරක සභාවේ සභාපති සහ ලේකම් විසින් අත්සන් කර බලය පැවරීමේ ලිපියක් නිකුත් කල යුතුය. ඒ සෑම ලිපියකම සහතික කරන ලද පිටපතක් ඒ ඒ අවස්ථාවේදීම සමිතියේ ලේකම් තැනට ද යැවිය යුතුය.

30.5 නියෝජිතයන් ප්‍රාදේශික කාරක සභිකයන් අතුරෙන් තෝරා පත්කළ යුතුවෙයි.

30.6 එහෙත් ප්‍රාදේශික කාරක සභාවක් විසින් මහා සභාව සඳහා 27.3 අතුරු ව්‍යවස්ථාව පරිදි නියෝජිතයන් පත් කර 27.4 අතුරු ව්‍යවස්ථාව පරිදි බලය පවරා ලිපි නිකුත් නොකළ අවස්ථාවක මහා සභා රැස්වීම සඳහා එය බාධාවක් නොවන්නේ ය.

**31. පුරප්පාඩු**

31.1 ප්‍රාදේශික කාරක සභාවක් විසින් තෝරා පත්කරනු ලබන යම්කිසි නියෝජිතයෙකුට සමිතියේ සාමාජිකත්වය නැති වුවහොත් හෝ ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකත්වය නැති වුවහොත් හෝ එසේ සමිතියේ සාමාජිකත්වය නැතිවන හෝ ප්‍රාදේශික කාරක සභාවේ සාමාජිකත්වය නැතිවන හෝ ඒ අය වෙනුවට වෙනත් නියෝජිතයකු තෝරා පත් කිරීමට ඒ ප්‍රාදේශික කාරක සභාවට බලය ඇත.

31.2 එසේ පත් කරනු ලබන නියෝජිතයෙකුට ද ප්‍රාදේශිකයේ සභාපති හා ලේකම් තැන විසින් අත්සන් කරන ලද බලය පැවරීමේ ලිපියක් දිය යුතුය. එයින් සහතික කරන ලද පිටපතක් සමිතියේ ලේකම් තැනට යැවිය යුතුය.

31.3 සමිතියේ මහා සභාවේ පුරප්පාඩුවක් ඇතිවීම හේතුවෙන් පමණක් මේ අතුරු ව්‍යවස්ථාවලින් හෝ සමූපකාර සමිති පිළිබඳ නීතියෙන් හෝ සමිතියේ මහා සභාවට පැවරී ඇති කටයුතු කරගෙන යාමට නුසුදුසුකමක් ඇති නොවේ.

**32. මහා සභා රැස්වීම්**

32.1 සෑම වර්ෂයක් පාසාම සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. එක් වර්ෂයක එවැනි මහා සභාවක් පවත්වා මාස 15 ක් ගතවීමට පෙර ඊළඟ වාර්ෂික මහා සභාව පැවැත්විය යුතුය. එහෙත් සමිතිය ලියාපදිංචි කර 18 මාසයක් ඇතුළත සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වුවහොත් සමිතිය ලියාපදිංචි කළ වර්ෂයේදී හෝ ඊළඟ වර්ෂයේදී තවත් වාර්ෂික සභා රැස්වීමක් පැවැත්වීම අනවශ්‍යය.

32.2 වාර්ෂික සභා රැස්වීම හැර සමිතියේ මහා සභාවේ අනිකුත් සියළුම රැස්වීම්වලට විශේෂ මහා සභා රැස්වීම් යයි නම් කරනු ලැබේ.

32.3 කොමසාරිස්තුමා විසින් හෝ කොමසාරිස්තුමා විසින් ඒ සඳහා බලය පවරන ලද කෙනෙකු විසින් හෝ සමිතියේ සභාපති තැන විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ සමිතියේ මහා සභා රැස්වීමක් කැඳවිය හැකිය.

32.4 කොමසාරිස්තුමා විසින් හෝ කොමසාරිස්තුමා විසින් ඒ සඳහා බලය පවරන ලද කෙනෙකු විසින් හෝ සමිතියේ සභාපති තැන විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ලියවිල්ලකින් දැන්වූ විට සමිතියේ ලේකම් තැන සමිතියේ මහා සභාවේ රැස්වීමක් කැඳවීමට ලිඛිත දැන්වීම් සෑම නියෝජිතයකුටද, අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකුටද යැවිය යුතු වන්නේය.

32.5 කොමසාරිස්තුමා විසින් හෝ කොමසාරිස්තුමා විසින් ඒ සඳහා බලය පවරන ලද කෙනෙකු විසින් සමිතියේ මහා සභාවේ රැස්වීමක් කැඳවන අවස්ථාවක කැඳවීමට අදාල ලිඛිත දැන්වීම් සෑම නියෝජිතයකුටද, අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකුටද යැවීම සඳහා සහ රැස්වීම පැවත්වීම සඳහා අවශ්‍ය විය හැකි සියළු පහසුකම් සමිතිය විසින් සැපයිය යුතු වන්නේය.

32.6 ප්‍රාදේශික කාරක සභා සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් කොටසකට හෝ සමිතියේ මහා සභාවට තෝරා පත්කරන ලද නියෝජිතයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් කොටසකට හෝ නොඅඩු ගණනක් විසින් ලියවිල්ලකින් ඉල්ලා සිටි විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමිතියේ මහා සභාවේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.ඉහත සඳහන් පරිදි විශේෂ මහා සභා රැස්වීමක් ඉල්ලුම් කරන අය ඒ විශේෂ සභා රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන යෝජනා විශේෂ මහා සභා රැස්වීම කැඳවීමට තමන් යවන ඉල්ලීමෙහි සඳහන් කළ යුතුය. එවැනි ලියවිල්ලකින් කරන ලද ඉල්ලීමක් අනුව මසක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියා කළ යුතුය.

32.7 සමිතියේ වාර්ෂික මහා සභාව සඳහාද, කොමසාරිස්තුමා විසින් හෝ එතුමාගෙන් ඒ සඳහා බලයලත් තැනැත්තෙකු විසින් හෝ කැඳවන ලද්දා වූද, අවස්ථාවලදී හැර අනිත් අවස්ථාවලදී මහා සභා රැස්වීම ගැන යටත් පිරිසෙයින් දින 7 ක් වත් කල් ඇතිව සමිතියේ මහා සභාවේ සාමාජිකයින්ට ලිඛිත දැන්වීම් යැවිය යුතු වේ. රැස්වීම පවතින දිනය, වේලාව සහ ස්ථානය ද, එහිදී සිදු කිරීමට අපේක්ෂිත කටයුතු ද, ඒ දැන්වීම් පත්‍රයෙහි සඳහන් විය යුතුය.

32.8 කොමසාරිස්තුමා හෝ ඒ සඳහා එතුමාගෙන් බලයලත් කෙනෙකු හෝ සමිතියේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවන අවස්ථාවලදී එහි පැමිණීමට බලය ඇති සාමාජිකයින්ට යටත් පිරිසෙයින් පැය 48 ක්වත් කල් ඇතිව දැනුම් දීම අවශ්‍ය ය. එහෙත් එම රැස්වීම කැඳවනු ලබන්නේ කාරක සභිකයින් තෝරා ගැනීම සඳහා වේ නම් දින 14 කට වත් ප්‍රථම සාමාජිකයන් දැනුවත් කල යුතු වන්නේය.

32.9 සමිතියේ වාර්ෂික මහා සභා රැස්කරවීමේ අදහස යටත් පිරිසෙයින් දින 21 වත් කලින් ඊට සහභාගී වීමට බලය ඇති අයට දැන්විය යුතු වේ. තවද, එහිදී කිරීමට සිදු කිරීමට අපේක්ෂිත කටයුතු ගැන යටත් පිරිසෙයින් රැස්වීමට දින 7ක් වත් කලින් ඔවුනට දැනුම් දිය යුතුය. සමිතියේ මහා සභාවේ යම්කිසි සාමාජිකයෙකු වාර්ෂික සභා රැස්වීමට යම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම් එවැනි යෝජනාවක පිටපතක් ද සමඟ ඒ බව රැස්වීම පැවැත්වීමට නියම දිනයට දින 14 ක් වත් කලින් සමිතියේ ලේකම් තැනට දැන්විය යුතුය. එවැනි යෝජනා සාමාජිකයින්ට යවන දැන්වීමෙහි ඇතුලත් කිරීම ලේකම් තැන විසින් කළ යුතු වේ.

32.10 සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමක් සඳහා යවන පළමුවන දැන්වීමත් සමඟ ගණන් පරීක්ෂක තැනගේ සාමාන්‍ය වාර්තාවේ සහ ගණන් පරීක්ෂණයට භාජන වූ ගිණුම් ලේඛණයේ පිටපත් යැවිය යුතු වෙයි.

32.11 සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට කල් ඇතිව ගණන් පරීක්ෂණයට භාජනය වූ ගිණුම් ලේඛනය හා ගණන් පරීක්ෂක තැනගේ සාමාන්‍ය වාර්තාව සමිතියට ලැබී නැති අවස්ථා වලදී වුවද, 29.1 වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු වෙයි.

32.12 එහෙත් ගණන් පරීක්ෂණයට භාජනය වූ ගිණුම් ලේඛනයත්, ගණන් පරීක්ෂක තැනගේ සාමාන්‍ය වාර්තාවත් ලැබුණ වහාම ඒවා ගැන සලකා බැලීම සඳහා සමිතියේ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය. ගණන් පරීක්ෂණයට භාජනය වූ ගිණුම් ලේඛනය සහ ගණන් පරීක්ෂක තැනගේ සාමාන්‍ය වාර්තාවේ පිටපත් ඒ සභා රැස්වීම කැඳවන දැන්වීමත් සමග සමිතියේ මහා සභාවේ සෑම සාමාජිකයාටම යැවිය යුතුය.

32.13 ගණන් පරීක්ෂක තැනගේ වාර්තාව සලකා බැලීමට නියමිත සමිතියේ සෑම මහා සභා රැස්වීමක් පිළිබඳවම ගණන් පරීක්ෂක තැනට දැන්විය යුතුය. එවැනි රැස්වීමකට පැමිණ කථා කිරීමට ඔහුට බලය ඇත.

**33.** **මහා සභාවේ කාර්යයන්**

සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීමේදී සාමාන්‍ය වශයෙන් කළයුතු දේ මෙසේය:

(අ) ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයන්ගෙන් ලබා ගත හැකි උපරිම ප්‍රමාණය නියම කිරීම

(ආ) එක් එක් සාමාජිකයාට දිය හැකි උපරිම ණය ප්‍රමාණය නියම කිරීම

(ඇ) කාරක සභිකයින් තෝරා පත්කර ගැනීම

(ඈ) රෙජිස්ට්‍රාර්තුමාගේ වාර්තාවක් වෙතොත් එය සලකා බැලීම

(ඉ) ගිණුම් පිළිබඳ වාර්තාව සලකා බැලීම

(ඊ) සමිතියේ ගණන් පරීක්ෂණයට භාජන වූ ගිණුම් ලේඛනය හා ගණන් පරීක්ෂක තැනගේ වාර්තාවද ගණන් පරීක්ෂණයට භාජන වූ ගිණුම් ලේඛන හා ගණන් පරීක්ෂක තැනගේ වාර්තාවද සලකා බැලීම.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සලකා බැලීම.

(ඇ) මේ අතුරු ව්‍යවස්ථා අනුව සමිතියේ ලාභ බෙදා හැරීමේ තීරණ ගැනීම.

**34. ගණපූරණය**

34.1 කොමසාරිස්තුමා විසින් හෝ ඒ සඳහා එතුමාගෙන් බලයලත් කෙනෙකු විසින් කැඳවන අවස්ථාවලදී හැර මෙම අතුරු ව්‍යවස්ථාවල අන් තැනක විශේෂ නියමයක් කර නොමැති සෑම අවස්ථාවලදීම සමිතියේ මහා සභා රැස්වීමකදී යම් කිසි කටයුත්තක් කිරීමට සමිතියේ මහා සභාවට නියෝජිතයින් වශයෙන් පැමිණීමට බලය ඇති අයගෙන් තුනෙන් එකක්ද, එවැනි නියෝජිතයන්ගෙන් 25 දෙනෙක් ද යන සංඛ්‍යා දෙකෙන් අඩු සංඛ්‍යාව පැමිණ සිටීම අවශ්‍ය වේ.

34.2. කොමසාරිස්තුමා හෝ එතුමාගේ බලය ලත් කෙනෙකු හෝ කැඳවූ රැස්වීමකදී කටුයතු කිරීමට යටත් පිරිසෙයින් එවැනි නියෝජිතයින් 03 දෙනෙකු පැමිණ සිටීම අවශ්‍යය. එහෙත් එම රැස්වීම කැඳවනු ලබන්නේ කාරක සභිකයින් තෝරා ගැනීම සඳහා වේ නම් එවැනි රැස්වීමක කාර්යයන් කිරීමට අවම වශයෙන් සාමාජිකයන් 10 දෙනෙකුවත් සිටිය යුතු වේ.

34.3 මෙම අතුරු ව්‍යවස්ථාවල අන් තැනක විශේෂ නියමයක් කර නොමැති අවස්ථාවක හැර අතුරු ව්‍යවස්ථාවල විධාන වලට යටත් ව සමිතියේ මහා සභාවේ සාමාජිකයින්ට හැර අන් කිසිවෙකුට සමිතියේ මහා සභාවේ කිසිම සභා රැස්වීමකට පැමිණීමට හෝ එහිදී කථාකිරීමට හෝ බලය ඇති නොවේ.

34.4 සමිතියේ මහා සභාවේ රැස්වීමකට හෝ ඕනෑම ප්‍රාදේශික මහා සභා රැස්වීමකට හෝ පැමිණ කථා කිරීමට කොමසාරිස්තුමාට හෝ එතුමාගෙන් ඒ සඳහා බලයලත් තැනැත්තෙකුටත් , සමිතිය භාර සමූපකාර සංවර්ධන ප්‍රාදේශිය නිලධාරී තැනටත් බලය ඇත.

34.5 සමිතියේ මහා සභාවේ සෑම රැස්වීමකටද, අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම රැස්වීමකටද, පැමිණීමට සමිතිය භාර සමූපකාර සංවර්ධන ප්‍රාදේශිය නිලධාරීට ආරාධනා කිරීම ලේකම් තැනගේ යුතුකම වන්නේය

34.6 සමිතියේ මහා සභා රැස්වීම් සඳහා දින නියම කර ගැනීම සමිතිය භාර සමූපකාර සංවර්ධන ප්‍රාදේශිය නිලධාරී තැන හා දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන කොමසාරිස් විමසා කල යුතුය.

**35. ඡන්දය භාවිතා කිරීම**

35.1 සමිතියේ මහා සභාවට ඉදිරිපත් වන සෑම කරුණක්ම තීන්දු වන්නේ ඒ ගැන කරන ලද යෝජනාවකිනි. යම් යෝජනාවක් පිළිගැනීම සඳහා අන්‍ය ක්‍රමයක් මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන්ව නැතිනම් 34.1 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ගණපූරණය ඇති රැස්වීමකදී එහි පැමිණ සිට ඡන්දය දෙන ලද සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවකට වැඩි ගණනක් යෝජනාවට එකඟව ඡන්දය දුන්විට එය පිළිගත් බවට සලකනු ලැබේ.

35.2 එක් මහා සභාවකදී කරන ලද තීරණයක් හමසක් ඇතුළත වෙනස්කළ හැක්කේ ඒ සඳහා කරන ලද යෝජනාවට මහා සභාවට පැමිණීමට බලය ඇති නියෝජිතයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකොටසකගේවත් ඡන්දය ලැබුණොත් පමණක්ය.

35.3 මේ අතුරු ව්‍යවස්ථාවලියේ 33.1 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ නියමිත අධ්‍යක්ෂ වරුන්ගේ සංඛ්‍යාව තෝරා පත් කිරීමට නම්, නිසි පරිදි යෝජනා කර ස්ථිර කරන ලද අපේක්ෂකයින්ගේ නම් මහා සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පැමිණ සිටින එක එක නියෝජිතයාට, තෝරා පත් කිරීමට නියමිත අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව හා සමාන ඡන්ද ගණනක් හිමි වේ. එහෙත් කිසිම නියෝජිතයකුට එක් අපේක්ෂකයකුට පක්ෂව එක ඡන්දයකට වැඩි ගණනක් දිය නොහැකිය. 32.1 අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන කෙසේ වෙතත්, 33.1 අතුරු ව්‍යවස්ථා වගන්තියේ සඳහන් සංයුතිය සංතෘප්ත වන පරිදි වැඩිම ඡන්ද ගණන ලබන අපේක්ෂකයන් තෝරා පත් වූ ලෙස සලකනු ලැබේ.

35.4 සමිතියේ මහා සභා රැස්වීමට පැමිණ සිටින්නාවූද, නියෝජිතයෙකු වන්නාවූද, එක එක සාමාජිකයාට එක ඡන්දයක් බැගින් ඇත. මුලසුන ගත් අය මහා සභාවෙන් විමසා දැනගත් පරිදි, ඡන්දය දීම අත් ඔසොවා පෙන්වීමෙන් හෝ රහස් ඡන්ද ක්‍රමයට හෝ කළහැක.

35.5 සභාපති හෝ ඔහු පැමිණ නොසිටියොත් උප සභාපති හෝ ඒ දෙදෙනාම පැමිණ නොසිටියොත් පොදු කැමැත්තෙන් තෝරාගත් සාමාජිකයෙකු හෝ සමිතියේ මහා සභා රැස්වීමකදී මුලසුන ගත යුතුය.

35.6 කොමසාරිස්තුමා විසින් හෝ කොමසාරිස්තුමාගෙන් බලය ලත් කෙනෙකු විසින් හෝ කැඳවූ රැස්වීමකදී නම් කොමසාරිස්තුමාට හෝ එසේ බලය ලත් කෙනෙකු මුලසුන ගත යුතු ය.

35.7 ඡන්ද ගණන සමාන වූ විට ඒ සභා රැස්වීමේ මුලසුන දරන්නා මෙහි අන් තැනක සඳහන් පරිදි ඡන්ද බලය ඇති අයෙකු නම් ඔහුට තීරක ඡන්දයක් දිය හැකිය. තීරක ඡන්දය භාවිත නොවන අවස්ථාවක එම යෝජනාව ප්‍රතික්ෂේප වූවා සේ සැලකිය යුතුය. කෙසේ වුවද කාරක සභිකයන් තෝරා ගනු ලබන නිලවරණයකදී තීරක ඡන්ද භාවිත නොවිය යුතු අතර කුසපත් ඇදීමෙන් තීරණ ගත යුතුය.

## 4 කොටස
## සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා නිලධාරීන්

**36. සංයුතිය**

36.1 සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිය යුතුය. සමිතියේ මහා සභාව නියෝජනය කරන සාමාජිකයන් විසින් මෙහි අන් තැන්හි සඳහන් අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව එකී නියෝජිතයන් අතරින් තෝරා පත් කරනු ලබන යටත් පිරිසෙයින් (පත් කරනු ලබන අවස්ථාවේදී ) වයස අවුරුදු දහ අටත් තිස්පහත් අතර (අවු. 18-35) සාමාජිකයින් දෙදෙනෙකුවත් ඇතුළත් වන සාමාජිකයන් හත් (07) දෙනෙකුගෙන් එම අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතුය.

36.2 ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනිමෙන් පසුව පැවැත්වෙන සමිතියේ මහසභාවේ පළමුවන රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර ගත යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය නිතරගයෙන් පත් නොවන අවස්ථාවක රහස් ඡන්දයෙන් තෝරා පත්කර ගත යුතුය.

36.3 එකී මහා සභාව සඳහා ඡන්ද නිලධාරියකු හා අවශ්‍ය විය හැකි සහකාර ඡන්ද නිලධාරීන් සංඛ්‍යාවක් පත් කිරීමේ බලය කොමසාරිස්වරයාට ඇත්තේ ය.

36.4 අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත් කර ගැනීමේ අවස්ථාවේ මුලසුන කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන ඡන්ද නිලධාරියා විසින් දැරිය යුත්තේය.

**37. අධ්‍යක්ෂ මණ්ඩල සංස්ථාපනය**

37.1 පහත සඳහන් අය අධ්‍යක්ෂ මණ්ඩල තෝරා පත් කිරීම, නම් කිරීම, පුරප්පාඩු පිරවීම සඳහා පත් කිරීම හෝ කළ නොහැකිය.

I. වයස අවුරුදු 18 ට අඩු කෙනෙක්
II. බංකොලොත් කාරයෙකු වීමට ඉල්ලා තිබෙන කෙනෙක් හෝ බංකොලොත්කාරයෙකු ලෙස උසාවියක් විසින් පිළිගත් කෙනෙක්
III. සිහි විකල් වූ කෙනෙක්
IV. පසුගිය තුන් වර්ෂය ඇතුලත දූෂ්චරිතය සම්බන්ධ නඩුවකින් වරදකරුවකු වූ කෙනෙක් හෝ තුන් මසකට අධික කාලයක් සිර දඬුවම් ලැබීමට නියම වූ කෙනෙක්
V. සමිතියට හෝ වෙනත් ලියාපදිංචි කල සමිතියකට හෝ ඇවරකරුවකුට හෝ ගෙවිය යුතු ණයක් හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම වර්ෂ 6 ක් තුළ තුන් මසකට අධික කාලයක් පැහැර හැර ඇති කෙනෙක් හෝ සමිතියට හෝ වෙනත් සමිතියකට හෝ ඇවර කරුවකුට හෝ ගෙවිය යුතු වෙනයම් මුදලක් ආපසු ගෙවීම පැහැර හැර තිබෙන කෙනෙක්
VI. සමිතිය සමග ඇති කර ගන්නා ලද ගිවිසුමක් හෝ සමිතියේ යම් විකිණීමක් හෝ මිළයට ගැනීමක් හෝ සමිතියේ මුදල් සම්බන්ධයෙන් එවකට ඇති කර ගෙන තිබෙන්නා වූ ද ඇති කර ගැනීමට විධි විධාන

සකස් කර ගෙන යන්නා වූ ද ගිවිසුමක් හෝ ගණුදෙනුවක් පිළිබඳව සාමාජිකයකු හෝ සේවකයකු හෝ වශයෙන් හැර තමන් විසින්හෝ අන් අයෙකුගේ මාර්ගයෙන් හෝ සම්බන්ධයක් ඇති කෙනෙක්

VII. පසුගිය වර්ෂ 6 ක් තුළ පිට පිටම කාර ක සභාවට තෝරා පත් වූ කෙනෙක්

VIII. මහා සභාවේ තීරණය පරිදි සමිතියේ දියුණුවට බාධක යම් වෙළදාමක් හෝ වෙනත් කටයුත්තක තමන්ගේම හෝ අන් අයෙකුගේ මාර්ගයෙන් හෝ යෙදී සිටින කෙනෙක්

IX. පසුගිය වර්ෂයක කාලය ඇතුලත ස්ව කැමැත්තෙන් අධ්‍යක්ෂ ධූරයෙන් ඉල්ලා අස් වූ කෙනෙක් හෝ පසුගිය වර්ෂයක කාලයක් ඇතුලත විශ්වාස භංග යෝජනාවකින් අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් කරනු ලැබූ කෙනෙක්

X. සමුපකාර නීතිය යටතේ කොමසාරිස්වරයා විසින් නිලයෙන් පහ කරන ලද, සමුපකාර නීතියේ සඳහන් කාලයට අදාලව නුසුදුසු වන කෙනෙක් හෝ රෙජිස්ට්‍රාර් විසින් අසාදු ලේඛණගත කර ඇති කෙනෙක්

XI. ප්‍රාදේශික කාරක සභාව විසින් මහා සභා නියෝජනය සඳහා පත් කර නැති සාමාජිකයෙකු වන කෙනෙක්

XII. පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක, හෝ ප්‍රාදේශිය සභාවක මන්ත්‍රිවරයකු, සභිකයෙකු වන කෙනෙක්

XIII. කොමසාරිස්වරයා පත් කරන අවස්ථාවක දී හැර දකුණු පලාතේ සමුපකාර සමිතියක සේවකයකු වන කෙනෙක්

XIV. කොමසාරිස්වරයා පත් කරන අවස්ථාවක දී හැර දකුණු පළාතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියකු වන කෙනෙක්

37.2 අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරා පත් කර ගනු ලැබූ සෑම අධ්‍යක්ෂ වරයකුම තෝරා පත් කිරීමෙන් දින 14 ක් ගත වීමට ප්‍රථම තමා එසේ තෝරා පත් කිරීමට නුසුදුසු නොවන බවට දිව්රුම් ප්‍රකාශ මෙහි අතුරු ව්‍යවස්ථාව යටතේ නුසුදුසුකම් නොමැති බවට හයවන උපලේඛණයේ සඳහන් ආකෘතියෙන් කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකුට භාර දිය යුතුය.

37.3 තෝරා පත් කර ගැනීමෙන් සහ නම් කිරීමෙන් දින 14 ක් ගත වීමට ප්‍රථම මෙම දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් නොකරන අධ්‍යක්ෂ වරයකුගේ අධ්‍යක්ෂ තනතුර එම කරුණින්ම අහෝසි වන්නේය.

37.4 තේරී පත්වන සෑම අධ්‍යක්ෂවරයෙකුම එසේ තේරී පත්වන දිනයේ සිට මාස 03 ක් ඇතුලත හා ඉන් අනතුරුව එළඹෙන එක් එක් අනුක්‍රමික වසරකම පරිදි ජූලි මස 31 දිනට පෙර මාර්තු 31 වන දිනට පැවති

(අ) ඔහුගේ සියළු වත්කම් බැරකම් පිළිබඳව ද,

(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියළු වත්කම් බැරකම් පිළිබඳව ද

(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියළු වත්කම් බැරකම් පිළිබඳව ද වන තොරතුරු කොමසාරිස්වරයා විසින් නියම කර ඇති ආකෘතිය අනුව

සම්පූර්ණ කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශයන් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත හෝ ඔහු විසින් බලය පවරන තැනැත්තකු වෙත ඉදිරිපත් කල යුතුය.

37.5 ඉහත පරිදි වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකරන තැනැත්තන්ගේ ධූරයන් එම කරුණින්ම අහෝසි වන්නේ ය.

37.6 ඉහත 34.2 හා 34.4 අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි ඉදිරිපත් වන ප්‍රකාශයන් අසත්‍ය බව තහවුරු වුවහොත් වර්ෂ හතක් (07) ගතවන තුරු සමිතියේ කිසිදු ධූරයක් දැරීමට නුසුදුසු වන්නේ ය.

37.7 තෝරා පත් කරන අධ්‍යක්ෂවරයෙකුගේ නිලය පහත කරුණක් නිසා නැති වන්නේය.

i. මෙම අතුරු ව්‍යවස්ථාවේ 37.1 වන වගන්තිය අනුව සුදුසුකම් නොමැතිවීම.
ii. සමිතියේ ලේකම් තැනට ලියවිල්ලකින් මාසයක් කල්දී ඉල්ලා අස්වීම.
iii. කොමසාරිස්තුමා විසින් කරන ලද නම් කිරීම් අහෝසි කිරීම.
iv. සමිතියේ සාමාජිකත්වය නැතිවීම.
v. සමිතියේ මහා සභා රැස්වීමකදී නිසි පරිදි සභා සම්මත වූ විශ්වාස භංග යෝජනාවකින් නිලයෙන් පහ කිරීම.
vi. සමුපකාර නීතියට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ නොකිරීම හෝ ප්‍රකාශ කරන ලද වත්කම් හා බැරකම් සාවද්‍ය බව හෙලිවීම.
vii. පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශිය සභාවක මන්ත්‍රිවරයෙකු වශයෙන් තේරී පත්වීම.
viii. සමිතියේ ලේකම්වරයා වෙත විධිමත් දැනුම් දීමකින් තොරව පිට පිටම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 03 කට නොපැමිණීම නිසා ඔහුගේ තනතුර අහෝසි වූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනාවක් සම්මත කර පිළිගැනීම.
ix. සිහිය විකල් වීම
x. මහා සභාවේ අදහස පරිදි සමිතියේ දියුණුවට බාධක යම් වෙළදාමක් හෝ යම් කටයුත්තක් ආරම්භ කිරීම , පවත්වා ගෙන යාම හෝ එවැනි වෙළදාමක හෝ කටයුත්තක සම්බන්ධතාවයක් ඇති කර ගැනීම
xi. බංකොලොත් කාරයෙකු වීමට ඉල්ලා සිටීම හෝ බංකොලොත්කාරයෙකු වශයෙන් උසාවියක් විසින් පිළිගැනීම
xii. තෝරා පත් කර ගැනීමෙන් සහ නම් කිරීමෙන් දින 14 ක් ගත වීමට ප්‍රථම විධිමත් පරිදි දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් නොකිරීම
xiii. අතුරු ව්‍යස්ථා අංක 34.4 සඳහන් පරිදි වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම
xiv. කොමසාරිස්වරයා පත් කරන අවස්ථාවක දී හැර දකුණු පලාතේ සමුපකාර සමිතියක සේවකයකු ලෙස පත්වීමක් බාර ගත් කෙනෙක්
xv. කොමසාරිස්වරයා පත් කරන අවස්ථාවක දී හැර දකුණු පළාතේ සමුපකාර සංංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියකු ලෙස පත්වීමක් භාරගත් කෙනෙක්

37.6 තෝරා පත් කරන ලද අධ්‍යක්ෂවරුන්ගේ නිල කාලය සමිතියේ ඊළඟ ප්‍රාදේශික කාරක සභා තෝරා ගැනීමෙන් පසු සංස්ථාපනය වන මහසභාවේ පළමුවෙනි රැස්වීමේ දි අවසන් වන්නේය. එසේ නිල කාලය අවසන් වන අධ්‍යක්ෂවරයෙකු නැවතත් තෝරා පත් කර ගත හැකිය. එහෙත් එසේ කළ හැක්කේ ඔහු ප්‍රාදේශික නියෝජිතයෙකු නම් පමණකි.

37.8 කොමසාරිස්තුමා විසින් නම් කරන අධ්‍යක්ෂවරු ඔවුන් පත් කල ඒ කාල පරිච්ඡේදය තුල නිලයන් දැරිය යුතුය. එහෙත්, කොමසාරිස්තුමා නියම කළ කාලසීමාව අවසන් වීමට පෙර ඔවුන්ගේ නිල අවලංගු කිරීමට එතුමාට හැක.

37.9 අතුරු ව්‍යවස්ථාවේ විධාන කෙසේ වෙතත් සමිතිය ලියාපදිංචි කලායින් පසු මහසභාවේ පළමුවන රැස්වීම පවත්වන තෙක් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් ක්‍රියා කිරීමට හත් (7) දෙනෙකුට නොවැඩි ගණනක් නම් කිරීමේ බලයත්, එයින් එක් කෙනෙකු සභාපති වශයෙන් නම් කිරීමේ බලයත් කොමසාරිස් තුමාට ඇති වන්නේය. එසේ පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලයට තාවකාලක අධ්‍යක්ෂ මණ්ඩලය යැයි කියනු ලැබේ. එම තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිසි පරිදි පිහිටුවන ලද අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති වන සියළුම අයිතිවාසිකම් යුතුකම් හා වගකීම් පැවරෙයි. තවද, මහසභාව නිසි පරිදි පිහිටුවන තෙක් මහසභාවට හිමි සියළු බලතලද ඊට ඇති වන්නේය.

**38.** **අධ්‍යක්ෂ මණ්ඩල පුරප්පාඩු**

38.1 තෝරා පත් කරන ලද අධ්‍යක්ෂවරයෙකුගේ මරණයෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ යම් කරුණක් නිසා හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ විට 38 (ii) අතුරු ව්‍යවස්ථාව යටතේ තෝරා ගත් කෙනෙකු ස්ථිර කිරීමට හෝ ඒ අය වෙනුවට කෙනෙකු තෝරා පත්කර ගැනීමට හෝ සමිතියේ මහසභා රැස්වීමක් හැකි පමණ ඉක්මණින් රැස්කරවීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කල යුතුය.

38.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇති වන පුරප්පාඩු සමිතියේයේ සාමාජික නාම ලේඛනයේ නම් සඳහන් 37.1 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නුසුදුසුකම්වලින් නොපෙළෙන අයගෙන් තාවකාලිකව පිරවීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත.

38.3 උක්ත 38.1 හා 38.2 අතුරු ව්‍යවස්ථාවල කෙසේ සඳහන් වුවද තෝරා පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ඉල්ලා අස්වීම මත පුරප්පාඩු වන අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සභිකයන් ඡන්ද විමසීමකින් තෝරා පත් කර ගෙන තිබේනම්, වසරක් ගතවන තුරු පුරප්පාඩු වූ සභික ධූරයකට ඡන්ද විමසීමේ ඊ ලඟට ඡන්ද ලබා ඇති අපේක්ෂකයා පත් කල යුතුය. එහෙත් ඔහු පත්වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊලඟ ඡන්ද හිමි අපේක්ෂකයා පත් කල

හැකි වන්නේ ය. කෙසේ නමුදු පුරප්පාඩු පිරවීමට අපේක්ෂකයන් නොමැති අවස්ථාවක හෝ ප්‍රාදේශික කාරක සභා නිලවරණය පවත්වා වසරක් ගත වී ඇති අවස්ථාවක හෝ ඉල්ලා අස්වීමක් නොවන ඕනෑම අවස්ථාවක 28.1 අතුරු ව්‍යවස්ථාව පරිදි පුරප්පාඩු පිරවිය හැකිය.

38.4 තම සම්පූර්ණ නිල කාලය අවසන් අවසන් වීමට පෙර තම නිලයෙන් ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාල අධ්‍යක්ෂ මණ්ඩල නිල කාලය තුළ නැවත තෝරා පත්කර ගැනීමට සුදුසුකම් නොමැත්තේය. එසේම ඉල්ලා අස්වීමෙන් වර්ෂයක් ඉකුත් වීමට පෙර නැවත පත්වීමටද සුදුස්සකු නොවන්නේ ය.

38.4 කාරක සභාවේ ඇති වන පුරප්පාඩු පිරවීමේදී 36.1 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සංයුතිය වෙනස් නොවිය යුතුය.

**39. අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු**

නීතියෙහි හෝ මේ අතුරු ව්‍යවස්ථාවල හෝ සඳහන් නියමයන්ටත් සමිතියේ මහසභාවේ තීරණ වලටත් යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් කටයුතු කල යුතු වන්නේය.

i. තමන් අතුරෙන් සමිතියේ සභාපතිවරයෙකු හා උප සභාපතිවරයෙකු තෝරා පත්කිරීම.
ii. අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සුදුස්සන්මහා සභා නියෝජිතයන් අතුරෙන් තෝරා ගැනීම.
iii. තම සාමාජිකත්වය ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට ප්‍රාදේශික කාරක සභාවක් විසින් කරන ලද තීරණයකට විරුද්ධව ඕනෑම කෙනෙකු විසින් ඉදිරිපත් කරන ආයාචනයන් පිලිබඳ තීරණයක් දීම
iv. සමිතියේ මහසභාව විසින් අනුමත කරනු ලබන උපරිම ප්‍රමාණයට යටත්ව සමිතියේ කටයුතු සඳහා අවශ්‍ය වන මුදල් ලබා ගැනිමේ මාර්ග හා ඒ පිලිබඳ කොන්දේසි නියම කිරීම.
v. කොමසාරිස්තුමා විසින් ඒ සඳහා අනුමත කරනු ලබන ක්‍රියා පිලිවෙලක් යටතේ එවැනි ක්‍රියා පිලිවෙලක් අනුව වැටුප් විනයානුකූල පාලනය හා සේවා අස්කිරීම් සම්බන්ධයෙන් නියම කළ හැකි කොන්දේසිවලට යටත්වද සාමාන්‍යාධිකාරිගේ අනෙක් ජ්‍යෙෂ්ඨ කළමණාකාර සේවකයන්ගේ සේවය ලබා ගැනීම.
vi. රුපියල් ලක්ෂ 2 දක්වා සමිතියට අවශ්‍ය වන නිශ්චල දේපල නොවන ස්ථාවර වත්කම් මිලයට ගැනීමෙන් හෝ වෙනත් මාර්ගයකින් හෝ අත්පත් කර ගැනීම.
vii. සමිතියේ මහසභාවේ පූර්ව අනුමැතිය ඇතිව රුපියල් ලක්ෂ 5 දක්වා සමිතියට අවශ්‍ය වන නිශ්චල දේපල නොවන ස්ථාවර වත්කම් මිලයට ගැනීමෙන් හෝ වෙනත් මාර්ගයකින් හෝ අත්පත් කර ගැනීම.

viii. සමිතියේ කොටස් විකිණීම, කොටස් පැවරීමට බලය දීම හා කොමසාරිස් හා රෙජිස්ටාර් වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව වෙනත් වෙළඳපොළ සංවිධානවල කොටස් සමිතිය වෙනුවෙන් ලබා ගැනීම.

ix. සමිතිය හෝ නිළධාරියෙකු හෝ සේවකයකු හෝ මගින් නඩු පැවරීම, නඩු ගැන කටයුතු කිරීම , විත්තියට කටයුතු කිරීම සමගියෙන් නඩු බේරා ගැනීම පවරන ලද නඩු අත්හැර දැමීම.

x. කොමසාරිස්වරයාගේ නියමයන්ට අනුගතව පොලී අනුපාත ඇතුළුව ණය දීම සඳහා ක්‍රියා පිළිවෙළවල් සකස් කිරීම

xi. කොමසාරිස්වරයාගේ නියමයන්ට අනුගත පොලී අනුපාත යටතේ තැන්පත් භාර ගැනීම, ආයෝජනය ඇතුළු මූල්‍ය සේවා සැපයීම සඳහා ක්‍රියා පිළිවෙළවල් සකස් කිරීම

xii. සමිතියේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි අනු කමිටු පත් කිරීම.

xiii. සමිතියේ කළමණාකරන මෙහෙයුම් වාර්තාව (එෆ් 28) සලකා බැලීම

xiv. දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කිරීම , නිසි පරිදි දායක මුදල් ගෙවීම හා අනෙකුත් නීතිමය නියමයන්ට අනුව දායක මුදල් ගෙවීම

**40. අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම් -**

අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම් මෙසේ වන්නේය.

(අ) සමිතියේ වාර්ෂික මහ සභා රැස්වීම ද , අවශ්‍ය වූ විට සමිතියේ වෙනත් මහසභා රැස්වීම් ද කැඳවීම.

(ආ) ප්‍රාදේශික මහසභා හා ප්‍රාදේශික කාරක සභා වලින් ඉදිරිපත් කරන කරුණු හා උපදෙස් ගැන සලකා බැලිමට හා ඒවා සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා කිරිමට විධායක නිලධාරීන්ට අණ කිරිම.

(ඇ) සමිතියේ සියළුම ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු සැලස්වීම

(ඈ) සමිතියේ කටයුතු වලට අදාල ගිනුම් හා සංඛයාන පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්සික අවසාන ගිණුම් හා ප්‍රකාශයන් සකස් කරවා මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් තුළ රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු බලය දෙන ලද යම් තැනැත්තෙකු වෙත ඉදිරිපත් කිරීම

(ඉ) ශේෂ පත්‍රයක් හා ගණන් පරීක්ෂණ වාර්තාවක් කොමසාරිස් තුමා විසින් බලය පවරන ලද කෙනෙකු විසින් පරික්ෂා කරවා සමිතියේ වාර්ෂික මහසභාවට ඉදිරිපත් කිරිම.

(ඈ) ඊලග මුදල් වර්ෂයේදී සමිතියේ ආදායම් ඉලක්ක,පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්, මූල්‍ය සහ මුදල් සම්පත්, මුදල් ආයෝජන, අයවැය ගත කරන ලද ලාභ අලාභ ගිණුම්, ආදායම් වියදම් ගිණුම් සහ ශෙෂ පත්‍රය දැක්වෙන අයවැය ලේඛණයක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම සකස් කර එම අයවැය ලේඛණය අදාල වන මුදල් වර්ෂය ආරම්භ වීමට යටත් පිරිසෙයින්

දෙමසකටත් පෙර සමිතියේ මහසභා රැස්වීමකට ඉදිරිපත් කිරීම හා එම අයවැය ලේඛණයේ පිටපතක් අදාළ වන මුදල් වර්ෂය ආරම්භ වීමට යටත් පිරිසෙයින් මසකටත් පෙර රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන තැනැත්තෙක් වෙත ඔහු විසින් නියම කරන අයුරින් යොමු කිරීම

(ඉ) යම්කිසි අළුත් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යෝග්‍යතා වාර්තා ලබාගෙන ඒ සම්බන්ධයෙන් වියදමක් කිරීමට පෙර ඒවා තක්සේරු කර බැලීම.

(ඊ) සමිතියේ කටයුතු පිළිබඳ ප්‍රගති වාර්තා මාස්පතාද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කල හැකි කාල පරිච්ඡේදය සඳහා වෙනත් විශේෂ වාර්තාද, අයවැය ලේඛණය. ඉලක්ක හා නියමිත මට්ටම් සමග සංසන්ධනය කිරීම සඳහා සාමාන්‍යාධිකාරි තැනගෙන් ලබා ගැනිම හා සාමාන්‍යාධිකාරි තැනට අදාල නියෝග නිකුත් කිරීම.

(උ) පහත දැක්වෙන කළමණාකාර කටයුතු සඳහා කාරක නියෝග හෝ ක්‍රියා පිළිවෙලවල් සකස් කිරීම. එනම්,

i. ප්‍රාග්ධන හා මුදල් සොයා ගැනීම හා පරිහරණය කිරීම පිලිබඳ මුදල් ප්‍රතිපත්තිය.
ii. තොග කර තැබිය යුතු වෙළඳ ද්‍රව්‍ය වල වර්ග හා ප්‍රමාණ , මිල මට්ටම් ද්‍රව්‍ය ලබා ගැනීමේද මුදල් ගෙවීමේ ද මාර්ග හා කොන්දේසි යන්න නියම කිරීමට අදාල වන මිලයට ගැනිමේ ප්‍රතිපත්තිය.
iii. කොමසාරිස්තුමා විසින් අනුමත කරන පිරිස් බල තක්සේරුවට අනුකූලව හා දකුණු පලාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ විධි විධාන අනුව සේවකයන් සේවයට බඳවා ගැනීම, පුහුණු කිරීම, වැටුප් වර්ධක ලබා දීම , උසස් කිරීම් හා විනයානුකූල පාලනය පිලිබඳ සේවක ප්‍රතිපත්තිය.
iv. සමිතියේ ස්ථිර සේවයට බැඳුන හා බැඳෙන සියළු සේවකයන් දකුණු පළාත් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කරවීම සඳහා අවශ්‍යවන සියළු කටයුතු කිරීම
v. මිළ මට්ටම් නෙයෙකුත් වර්ගයේ වෙළඳ ද්‍රව්‍ය පිලිබඳ දළ ලාභ තීරු වෙළඳාම් කොන්දේසි හා ද්‍රව්‍ය බෙදා හැරීමේ වෙනත් ප්‍රතිපත්ති නියම කිරීමට අදාල වන විකුණුම් මිළ පිලිබඳ ප්‍රතිපත්තිය.
vi. ප්‍රජාවෙහි සමිතියට හිමිවන ස්ථානය, සාමාජිකයන්ද මහජනයාද සමග සම්බන්ධතාවය සංවිධානයේ පිළිඹිඹු කළ යුතු ස්වරූපය නියම කිරීමට අදාල මහජන සම්බන්ධතා ප්‍රතිපත්තිය
vii. අධ්‍යාපනික, සංස්කෘතික, යහපත් විනෝද කටයුතු හා සමාජ සේවා කටයුතු.

(ඌ) සමිතියේ වැඩ බාධා රහිතව කිරීමට වග බලා ගැනීම මේ අතුරු ව්‍යවස්ථා හා සමුපකාර සමිති පිලිබඳ නීතියේ විධාන ක්‍රියාත්මක කිරීම හා අවශ්‍යතා පිලිපැදීම සමිතියේ පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය වුවද අදාළ වුවද විශේෂයෙන් විස්තර කර නොමැති හෝ සමිතියේ මහසභාවට හෝ සමිතියේ විශේෂ නිලධාරියෙකුට හෝ නිලධාරීන්ට හෝ වෙන් කර නොමැති හෝ අනිකුත් සියළුම කටයුතු කිරීම.

**41**. **අධ්‍යක්ෂවරුන්ගේ වගකීම -**

අධ්‍යක්ෂ මණ්ඩලය තම කටයුතු හා යුතුකම් බුද්ධිමත් ලෙස ඉටු කල යුතු වන්නේය. සැම විටම නීතිය, ප්‍රඥප්තිය, රීති මාලාව, කොමසාරිස්වරයාගේ චක්‍රලේඛ හා උපදෙස්, සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ හා උපදෙස්, මේ අතුරු ව්‍යවස්ථා හා කාරක සභා නියෝග, ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය ඇතුළු නෛතික විධිවිධාන අනුව ඔවුන් විසින් ක්‍රියා කල යුතු වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය නිසි පරිදි බුද්ධිමත් ලෙස ක්‍රියා නොකිරීම නිසා හෝ නීතිය සහ අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියා නොකිරීම නිසා හෝ සමිතියට ඇතිවන යම්කිසි අලාභයකට හෝ පිඩාවකට හෝ සමිතිය යටත්වන යම්කිසි දඩුවමකට හෝ අධ්‍යක්ෂවරු එක්ව හා වෙන් වෙන්ව වගකිව යුතු වන්නේය.

**42**. **අධ්‍යක්ෂ මණ්ඩලයේ සභා රැස්වීම.**

42.1 අවශ්‍ය සැම අවස්ථාවකදිම යටත් පිරිසෙයින් මසකට වරක් වත්ද, අධ්‍යක්ෂ මණ්ඩලය රැස් විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභා රැස්වීම්කදී කටයුතු කරගෙන යැම සඳහා එහි සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවකට වැඩි ගණනක් පැමිණ සිටිය යුතු වෙයි.

42.2 සභාපතිතුමා හෝ ඔහු පැමිණ නොසිටියහොත් උප සභාපතිතුමා හෝ ඒ දෙදෙනාම පැමින නොසිටියහොත් එවකට පැමිණ සිටින අය විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින් හෝ මුලසුන දැරිය යුතුය.

42.3 එක් සාමාජිකයෙකුට හිමි වන්නේ එක් ඡන්දයකි. ඡන්ද ගණන සමාන වූ විට සභාපති තැනට තීරක ඡන්දයක් ඇත.

42.4 සභාපතිතුමා හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ දෙකෙන් පංගුවකට වැඩි ගණක් විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ කොමසාරිස්තුමා හෝ කැඳවූ විට අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතු වන්නේය.

42.5 තවද, සභාපති අධ්‍යක්ෂ මණ්ඩලය හෝ කොමසාරිස්තුමා විසින් ඉල්ලා සිටින විටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවකට වැඩි ගණනක් ලියවිල්ලකින් ඉල්ලා සිටි විටත් ලේකම් තැන විසින් අධ්‍යක්ෂ මණ්ඩලය රැස් කල යුතු වන්නේය.

42.6 යම් කිසි අධ්‍යක්ෂ වරයෙකු පත් කිරීමේ හො තෝරා පත්කිරීමේ යම්කිසි දෝශයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ පරප්පාඩුවක් හෝ ඇති වූ පමණින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවන්නනේය.

42.7 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවීමට නියමිත දිනය සමිතිය භාර සමුපකාර සංවර්ධන නිලධාරිවරයා වෙත විධිමත්ව හා ප්‍රමාණවත් කාලයක් තුළ දැනුම් දීම ලේකම් තැන විසින් කල යුත්තේ ය. එම දැනුම්දීම සමඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳව ද දැනුවත් කිරීම කළ යුතුය.

42.8 මාසයකට එක් දිනක් සමිතියේ ග්‍රාමීය බැංකු අංශය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම, සමාලෝචනය, තීරණ ගැනීම ඇතුළු කාර්යයන් වෙනුවෙන් වෙන් කළ යුතුය. තවත් එක් රැස්වීමක ප්‍රමාණවත් කාලයක් සමිතියේ කළමණාකරණ හා

මෙහෙයුම් වාර්තාව (එෆ් 28) සාකච්ඡා කිරීම, සමාලෝචනය, තීරණ ගැනීම ඇතුළු කාර්යයන් වෙනුවෙන් වෙන් කළ යුතුය.

42.9 කොමසාරිස්වරයා හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු විසින් ඉල්ලා සිටි අවස්ථාවක සමිතියේ පොත්පත්, ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවක ඉල්ලා සිටි විට විධිමත් පරිදි සහතික කර ලබා දීම

**43**. **අධ්‍යක්ෂ මණ්ඩලයේ සභා රැස්වීම් වල වාර්තා**

43.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සභා රැස්වීමකදීම සාකච්ඡාවට ගත් කරුණු , තීරණ ඇතුළු තොරතුරු වාර්තා පොතක සමිතියේ ලේකම් තැන විසින් එම අවස්ථාවේ ම සටහන් කළ යුතුය.

43.2 එම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අතරතුර වරින් වර හෝ අවසානයේ ලේකම් තැන විසින් කියවා රැස්වීමේ පැමිණ සිටි අධ්‍යක්ෂවරුන් රැස්වීම අවසානයේදී එම වාර්තාවට අත්සන් තැබිය යුතුය.

43.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවට සමිති භාර සමුපකාර සංවර්ධන නිලධාරී තැනගේ අත්සන අවශ්‍ය නොවේ. එහෙත් ඔහු දක්වන අදහස්, උපදෙස් මෙන්ම සටහන් කිරීමට නියෝග කරන යම් කාරණා සටහන් කිරීම ලේකම් තැන විසින් කළ යුතු ය. ඕනෑම අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාගත කල කරුණු පරීක්ෂා කිරීමට සමිති භාර සමුපකාර සංවර්ධන නිලධාරී තැනට බලය ඇත.

**44**. **සභාපති හා උප සභාපති**

44.1 අධ්‍යක්ෂ මණ්ඩලය තමන් අතුරින් සමිතියේ සභාපති කෙනෙකු හා උප සභාපති කෙනෙකු තෝරා පත් කර ගත යුතුය.

44.2 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ කොමසාරිස්තුමා විසින් හෝ ඔවුන් තම නිල වලින් පහ කිරීම ඔවුනට නිල අහිමි වන තුරු හෝ මෙම අතුරු ව්‍යවස්ථාවලියේ සඳහන් යම්කිසි නුසුදුසු කමක් නිසා අධ්‍යක්ෂ තනතුර අහිමි වන තුරු හෝ මසකට කලින් ලේකම් තැනට ලියවිල්ලකින් දැනුම් දී ඉල්ලා අස්වන තුරු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලකාලය අවසන් වන තුරු හෝ ඔවුන් විසින් එම තනතුරු දැරිය යුතුය.

44.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති කෙනෙකු ඪ උප සභාපති කෙනෙකු තෝරා ගන්නා අවස්ථාවේ මුලසුන කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය දුන් අයෙකු හෝ සමිති භාර සමුපකාර සංවර්ධන නිලධාරී තැන හෝ දැරිය යුතු ය. එහෙත් මුලසුන දරන්නාට තීරක ඡන්දයක් හිමි නොවේ. ඡන්ද ගණන සමාන වුවහොත් කුසපත් ඇදීමක් සිදු කල යුතුය.

44.4 ඉහත සඳහන් විධානයේ කරුණු කෙසේ වෙතත්, සමිතිය සංස්ථාපනය කිරීමෙන් පසුව පවත්වනු ලබන මහ සභාවේ පළමුවන රැස්වීම තෙක් සමිතියේ සභාපති හා උප සභාපති තනතුරු සඳහා ඕනෑම දෙදෙනෙක් නම් කිරීමට කොමසාරිස්තුමාට බලය ඇත. එසේ නම් කරන ලද සභාපති තැනගේ හා උප සභාපති තැනගේ පත්වීම් මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාපති කෙනෙකු හා උප සභාපති කෙනෙකු තෝරා පත් කල විට අවසන් වනු ඇත.

44.5 ඉන්පසු ඕනෑම අවස්ථාවකදීද අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හෝ උප සභාපති හෝ එම දෙදෙනාම හෝ නම්කර පත් කිරීමට කොමසාරිස්තුමාට බලය ඇත. එවිට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තෝරා පත් කරන ලද සභාපති තැනගේ හෝ උප සභාපති තැනගේ හෝ ඒ දෙදෙනාගේම හෝ පත්වීම් ඒ කරුණින්ම අවලංගු වන්නේය.

44.6 සභාපතිතුමා අධ්‍යක්ෂ මණ්ඩලයේද සභාපති වෙයි. ඔහු පැමිණ සිටින අවස්ථාවලදී සමිතියේ මහසභා රැස්වීම්වලද අධ්‍යක්ෂ මන්ඩලයේ රැස්වීම් වලද මුලසුන දැරිය යුතුය. සමිතියේ සාමාන්‍යාධිකාරි තැනගේ හා අනෙකුත් සේවකයන්ගේ වැඩ පරිපාලනය කිරීමේ බලය ඔහුට ඇත. මේ අතුරු ව්‍යවස්ථාව පිළිපදින බවටද සමිතියේ මහසභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල තීරණ කාර්යක්ෂමව ලෙස නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට ද ඔහු විසින් වගකිව යුතු වෙයි.

44.7 සමිතියේ උප සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේද උප සභාපති වෙයි. සභාපති නොමැති අවස්ථාවලදී සමිතියේ මහසභා රැස්වීම් වල හා අධ්‍යක්ෂ මන්ඩලයේ රැස්වීම් වල මුලසුන දැරීමට උප සභාපතිට බලය ඇත. දිවයිනෙන් බැහැරව සිටින නිසා හෝ අසනීපයක් නිසා හෝ සභාපතිට තම කටයුතු කරගෙන යෑමට නොහැකි යැයි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ විට උප සභාපතිට සභාපතිතුමා වෙනුවට වැඩ බැලිය හැකිය.

44.8 සමුපකාර නීතියේ සඳහන් පරිදි සකස් කරන ලද සාමාජික නාමලේඛණයේ සහතික කල පිටපතක් සෑම ලිත් වර්ෂයක් ආරම්භ වී මාස තුනක් තුළ ඉකුත් වර්ෂය තුළ සිදු කරන ලද ඇතුළත් කිරීම්, ඉවත් කිරීම් ඇතුළු සියළු සංශෝධනයන් සහිතව කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තකු වෙත සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීම

44.9 කොමසාරිස්වරයා හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු විසින් ඉල්ලා සිටි අවස්ථාවක සමිතියේ පොත්පත්, ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවක ඉල්ලා සිටි විට විධිමත් පරිදි සහතික කර ලබා දීම සඳහා කටයුතු කිරීම

**45. ලේකම්**

45.1 සමිතියේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්ද වන්නේය,

45.2 සමිතිය විසින් පිළිගත් සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පිළිවෙළ යටතේ ලේකම් කෙනෙකු පත් කර ගත යුතුය.

45.3 සමිතියේ මහසභා රැස්වීම් , අධ්‍යක්ෂ මණ්ඩල සභා රැස්වීම් හා ප්‍රාදේශීය කාරක සභා, මහා සභා රැස්වීම් කැඳවීමට නිසි පරිදි බලය ලත් කෙනෙකු විසින් හෝ අය විසින් නියම කළ විට ඔහු විසින් ඒ සඳහා සභ රැස්වීම් කැඳවිය යුතුය.

45.4 ඔහු ඒ සෑම සභා රැස්වීමකටම පැමිණ ඒ රැස්වීම්වල වාර්තා සටහන් කර ගත යුතුය.

45.5 සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම් සමිතිය භාරව කොමසාරිස් තුමා විසින් පත්කල නිළධාරියා වෙත දැන්වීම විධිමත්ව අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි කලයුතුය.

45.6 රැස්වීම් සම්බන්ධයෙන් කළ යුතු සියළුම කටයුතු සභාපති තැන විසින් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ අණ කරන පරිදි කල යුතුය.

45.7 ලේකම් තැන විසින් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේඛණයක් පවත්වා ගත යුතුය. එක් එක් අධ්‍යක්ෂ වරයාගේ නම , ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, අධ්‍යක්ෂ තනතුරට පත් වූ දිනය , පත් වූ ආකාරය ඔහුගේ අධ්‍යක්ෂ තනතුර නැති වූ දිනයන් මේ කරුණු එම ලේඛණයෙහි දැක්විය යුතුය.

45.8 සමිතියේ ප්‍රාදේශික කාරකසභා තෝරා ගැනීමෙන් පසු සංස්ථාපනය වන මහසභාවේ පළමුවෙනි රැස්වීම පවත්වා දින 14 ක් ඇතුළත ඉහත සඳහන් විස්තර අඩංගු ලයිස්තුවක් කොමසාරිස්තුමාට ඉදිරිපත් කිරීම ලේකම් තැනගේ යුතුකම වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ යම්කිසි වෙනසක් ඇති වුවහොත් එසේ නැතිවී දින 14 ක් ඇතුලත ඒ බව කොමසාරිස් තුමාට දැන්විය යුතුය.

45.9 අතුරු ව්‍යවස්ථා අංක පරිදි ඡන්ද විමසීමකින් පසු පැවැත්වෙන පළමු කාරක සභා රැස්වීම ඒහි දක්වා ඇති පරිදි අවශ්‍ය වුවහොත් කැඳවීම කල යුතු ය.

45.10 සමිතියේ සාමාජික නාම ලේඛණය සෑම කාර්තුවකට වරක් පියවා ප්‍රදර්ශනය කිරීම සඳහා සාමාන්‍යාධිකාරී වෙත සහය ලබා දිය යුතුය. අතුරු ව්‍යවස්ථා අංක පරිදි පියවන ලද සාමාජික නාම ලේඛණය හා මහා සභා නියෝජිත සංඛ්‍යාව දැක්වෙන ලේඛණයකොමසාරිස්වරයා වෙත නියමිත පරිදි නියමිත කාලයේදී ඉදිරිපත් කල යුතුය.

45.11 ප්‍රාදේශික කාරක සභා ඡන්ද විමසීම වෙනුවෙන් පමිතියට කොමසාරිස්වරයා විසින් පත් කරන ඡන්ද නිලධාරී වෙත සියළු සහයන් ලබා දිය යුතුය.

45.12 කොමසාරිස්වරයා හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු විසින් ඉල්ලා සිටි අවස්ථාවක සමිතියේ පොත්පත්, ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවක ඉල්ලා සිටි විට විධිමත් පරිදි සහතික කර ලබා දීම සඳහා පියවර ගැනීම

45.13 විධිමත් පරිදි පියවන ලද සමිතියේ ඡන්ද හිමි නාම ලේඛණය හා එක් එක් ප්‍රාදේශිකය නියෝජනය කරමින් මහා සභාව නියෝජනය කල යුතු නියෝජිත සංඛ්‍යාව බලපැවැත්වෙන නෛතික ප්‍රතිපාදනයන්ට අනුගතව නියමිත කාල සීමාව තුළ කොමසාරිස්වරයා වෙත හෝ ඔහු විසින් බලය පවරන පුද්ගලයකු වෙත ඉදිරිපත් කිරීම සඳහා සකස් කිරීම

## **46**. සාමාන්‍යාධිකාරී

46.1 අතුරු ව්‍යවස්ථා 39(v) යටතේ සමිතියේ සාමාන්‍යාධිකාරීවරයෙකු පත් කර ගත යුතුය.

46.2 ඔහු සමිතියේ ප්‍රධාන විධායක නිලධාරි වන්නේය.සමිතියේ කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යෑම ගැන ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ප්‍රතිපත්තියට යටත්ව මේ

අතුරු ව්‍යවස්ථාව හා සමුපකාර සමිති පිළිබඳ නීතියට අනුකූලව සමුපකාර පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ඔහු අනලස්ව ක්‍රියා කළ යුතුය.

46.3 මේ අතුරු ව්‍යවස්ථා (i) වෙනි ඡේදයේ විධාන කෙසේ වෙතත් සමිතිය ලියාපදිංචි කළ විට වර්ෂයකට අධික නොවන කාලයක් සාමාන්‍යාධිකාරී වශයෙන් ක්‍රියා කිරීමට ඕනෑම කෙනෙකු පත් කිරීමට කොමසාරිස්තුමාට බලය ඇත.

46.4 ප්‍රධාන විධායක කිලධාරියා ලෙස සමිතියේ සාමාන්‍යධිකාරී වෙත පහත කාරයයයන් ප්‍රධාන වශයෙන් පැවරෙනු ඇත.

i. සමිතියේ දේපල හා පොත්පත්වල ප්‍රධාන භාරකරු ලෙස කටයුතු කිරීම හා ඒවා නඩත්තු කරමින් කටයුතු කිරීම සඳහා කාරයය මණ්ඩලය වෙත වගකීම් පැවරීම
ii. නෛතික රාමුව තුළ සේවක පරිපාලනය හා වැඩ අධීක්ෂණය
iii. බාහිර ආයතන හා පුද්ගලයන් සමඟ සම්බන්දීකරණය
iv. අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සඳහා සහය වීම හා අධ්‍යක්ෂ මන්ඩල තීරණ තැනීමට පහසු පරිසරයක් ගොඩනැංවීම
v. සාමාජික නාම ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කිරීම
vi. සාමාජික නාමලේඛණය කාර්තුවකට වරක් පියවීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා සේවක පිරිස මෙහෙයවීම
vii. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම
viii. සමිතියේ යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
ix. විධිමත් පරිදි නියමිත කාලය තුළ ප්‍රාදේශික කාරක සභා හා මහා සභා පැවැත්වීමට පියවර ගැනීම
x. සමුපකාර සමිතිය ලාභදායිව හා තිරසාරව පවත්වාගෙන යමින් ඒහි ඉහළ කාරයසාධනයක් ලබා කර ගැනීම පිණිස සියළු පියවර ගැනීම

46.5 සෑම විටම නීතිය, ප්‍රඥප්තිය, රීති මාලාව, කොමසාරිස්වරයාගේ චක්‍රලේඛ හා උපදෙස්, සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ හා උපදෙස්, මේ අතුරු ව්‍යවස්ථා හා කාරක සභා නියෝග, ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය ඇතුළු නෛතික විධිවිධාන අනුව ඔහු ක්‍රියා කල යුතු වන්නේය.

46.6 කොමසාරිස්වරයා හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු විසින් ඉල්ලා සිටි අවස්ථාවක සමිතියේ පොත්පත්, ලේඛන හා තොරතුරු ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවක ඉල්ලා සිටි විට විධිමත් පරිදි සහතික කර ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා කටයුතු කිරීම

46.7 සමුපකාර නීතියේ සඳහන් පරිදි සකස් කරන ලද සාමාජික නාමලේඛණයේ සහතික කල පිටපතක් සෑම ලිත් වර්ෂයක් ආරම්භ වී මාස තුනක් තුළ ඉකුත් වර්ෂය තුළ සිදු කරන ලද ඇතුළත් කිරීම්, ඉවත් කිරීම් ඇතුළු සියළු සංශෝධනයන් සහිතව කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තකු වෙත ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා කටයුතු කිරීම

46.8 විධිමත් පරිදි පියවන ලද සමිතියේ ජන්ද හිමි නාම ලේඛණය හා එක් එක් ප්‍රාදේශිකය නියෝජනය කරමින් මහා සභාව නියෝජනය කල යුතු නියෝජිත සංඛ්‍යාව බලපැවැත්වෙන නෛතික ප්‍රතිපාදනයන්ට අනුගතව නියමිත කාල

සීමාව තුළ කොමසාරිස්වරයා වෙත හෝ ඔහු විසින් බලය පවරන පුද්ගලයකු වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

## 5 කොටස
## මෙහෙයුම් කටයුතු

**47. ලිපි ලේඛණ පොත්පත්**

47.1 කොමසාරිස්තුමා විසින් වරින් වර නියම කරන සියළුම පොත්පත් ලේඛණ ලියකියවිලි සමිතිය විසින් පවත්වාගෙන යා යුතුය.

47.2 සමිතියේ සේවකයන් අතුරෙන් සේප්පුවේ යතුරු පොත්පත් ලේඛණ හා වෙනත් ලියකියවිලි භාරගෙන සුරක්ෂිතව තබා ගත යුතු සේවකයින් සමිතියේ සාමාන්‍යාධිකාරී වරයා විසින් නියම කළ යුතුය. ඔහු ඒ එක එක සේවකයාගෙන් ලදුපතක් ලබා ගෙන ඒවා සුරක්ෂිතව තබා ගත යුතුය.

47.3 සමුපකාර සමිති ප්‍රඥප්තියද ඒ යටතේ පනවන ලද නියෝග වලද, සමිතියේ අතුරු ව්‍යවස්ථාවලද පිටපත් හා සාමාජිකයන්ගේ නම් ලයිස්තුවක් සෑම යෝග්‍ය අවස්ථාවලදීම නොමිලයේ පරීක්ෂා කර බැලීමට සමිතියේ ලියාපදිංචි කල කාර්යාලයෙහි තැබිය යුතුය.

**48. මුදල් යෙදීම**

48.1 සමිතියේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් කටයුතු සඳහා ද සමිතියේ මුදල් යෙදිය හැකිය.

48.2 සේවකයන් බඳින ඇප මුදල් සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සමිතියේ නමින් ස්ථාවර තැන්පත් වශයෙන් වෙනම තැන්පත් කල යුතුය. එයින් ලැබෙන පොලිය ඒ ඒ සේවකයාට බැර කළ යුතුය.

48.3 සමිතියේ චෙක්පත් හා මුදල් ආපසු ලබා ගැනුමේ පෝරම සභාපතිතුමා විසින් හෝ උප සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරී තැන හෝ සාමාන්‍යාධිකාරි තැන වෙනුවට වැඩ බැලීමට පත්කරන ලද කෙනෙකු විසින් අත්සන් කල යුතුය.

48.4 සමිතියේ අයකුම් වෙත එක එක දින ලැබෙන මුදල් යටත් පිරිසෙයින් ඊළඟ දිනයේවත් කොමසාරිස් තුමා විසින් අනුමත බැංකුවක සමිතිය නමින් තැන්පත් කළ යුතුය.

48.5 එහෙත් සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ කායීරීති සංග්‍රහයේ දක්වා ඇති සීමාවන් අනුව ග්‍රාමීය බැංකු ශාඛාවල කළමණාකරු අත ඉතිරි සීමාවන් නියමකරගත යුතු වන්නේය.

**49. ණය**

49.1 පහත සඳහන් කරුණු වලට එකඟව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාජිකයන්ට ණය දිය හැකි අතර, රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව වෙනත් ලියාපදිංචි කල සමුපකාර සමිතියකට ණය දිය හැකිය. තවද, මහසභාවේ පූර්ව අනුමැතිය ඇතිව ආශ්‍රිත සාමාජිකයින්ට ද්‍රව්‍ය ණය දිය හැකිය.

49.2 ණය ඉල්ලුම්කරුට ඒ ණය අවශ්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සඳහා නිසි පරිදි බලය පවරන ලද කෙනෙකු හෝ සෑහීමකට පත්විය යුතුය.

49.3 එසේම, ඒ ණය ලබා ගන්නා කාරණය සඳහා වෙනත් මාර්ගයකින් තමා ණය ලබා නොගන්නා බවට ණය ඉල්ලුම්කරු විසින් ලියවිල්ලක් ඉදිරිපත් කල යුතුය. තවද, ණයකරු ලියාපදිංචි කළ වෙනත් සමිතිවලට හෝ වෙනත් ස්ථානවලට හෝ තමා විසින් ගෙවීමට තිබෙන ණය ලියකියවිල්ලකින් ප්‍රකාශ කළ යුතුය. අවශ්‍ය වුවහොත් පරීක්ෂා කිරීම සඳහා ණය තොරතුරු කාර්යංශයේ වාර්තාවක් ඉදිරිපත් කලයුතු ය.

49.4 ණය දිය හැක්කේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සඳහා නිසි පරිදි බලය පවරන ලද කෙනෙකුගේ හෝ අදහස් පරිදි සමිතියේ සාමාජිකයන්ගේ අභිවෘද්ධියට බාධා නොවන්නාවූ අවශ්‍ය හෝ ආදායම් උපදවන හෝ කටයුතු වලට පමණක්ය.

49.5 යම්කිසි ණයක් ආපසු ගෙවීමේ කාලය ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහය මඟින් නියම කර ඇති පරිදි විය යුතු ය.

49.6 ණය මුදල ඉල්ලා සිටින සාමාජිකයා ලබාගන්නා ණය මුදලින් (5%) සියයට පහකට නොඅඩු ප්‍රමාණයක් එකී ණයකරු විසින් සමිතියේ ග්‍රාමීය බැංකු ශාඛාවක සුරැකුම් තැන්පත් ගිණුමක තැන්පත් කළ යුතුය. මෙම තැන්පත් ගිණුම සඳහා සාමාන්‍ය ඉතිරි කිරීමේ තැන්පත් සඳහා ගෙවනු ලබන පොළියට සමාන පොලියක් ගෙවිය යුතු අතර, ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වනතුරු එම තැන්පත් මුදල සහ ඊට බැර කරනු ලබන පොලිය සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ආපසු නොගෙවිය යුතුය.

49.7 ණය පිළිබඳ කොන්දේසි භාරගත් බවට ණය ලබන සාමාජිකයාද, ඇපකරුවන් දෙදෙනෙක් ද ඔප්පුව, ගිවිසුම සඳහා අත්සන් තැබිය යුතුය.

49.8 පූර්වෝක්ත විධිවිධානයන් කෙසේ වෙතත් සමිතියේ ස්ථාවර හෝ ධන ආයෝජන හෝ ඉතිරි කිරීමේ හෝ තැන්පත් ගිණුමක ඇති ශේෂයක් ඇති සාමාජිකයෙකුට ඔහුගේ තැන්පත් ගිණුමේ ශේෂය ඇප වශයෙන් තබා ණය මුදලක් ලබා ගත හැකිය. සාමාජික නොවන තැනැත්තෙකුට තැන්පත් ශේෂය මත අත්තිකාරමක් ලබා දිය හැකිය.මොනම අවස්ථාවකදීවත් ඔහුගේ ණය මුදල හෝ අත්තිකාරම් මුදල තැන්පත් ගිණුමේ ශේෂයෙන් 85% වඩා අධික නොවිය යුතුය. එවැනි ණය සඳහා සාමාජිකයන් දෙදෙනෙකුගේ පුද්ගලික ඇප අනවශ්‍යය. එහෙත් නොගෙවන අවස්ථාවක තැන්පත් මුදලින් කඩිනමින් හිලවු කර ගැනීමට හැකි වන සේ ගිවිසුම්ගත විය යුතු ය.

49.9 ණයක් සම්බන්ධයෙන් මේ සමිතියට හෝ වෙනත් සමුපකාර සමිතියකට හෝ යම් කිසි සමුපකාර සමිතියක ඇවරකරුවකුට හෝ ගෙවීමක් අතපසු කර තිබෙන සාමාජිකයෙකුට ණය නොදිය යුතුය.

49.10 ණයකරු විසින් ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශනයෙහි යම්කිසි අසත්‍ය කරුණක් ඇති බව පසුව දැනගතහොත් හෝ ණය වාරික මුදලක් ආපසු ගෙවීම කල්පසු වූ විට හෝ ණයකරු විසින් ණය මුදල නිසි පරිදි නොයොදවන විට හෝ ණයකරුගේ මුදල් තත්වය හීන වී තිබෙන බව අධ්‍යක්ෂ මණ්ඩලයට වැටහුණු

විට හෝ කල් දීමක් නොමැතිව ණය ආපසු ඉල්ලා ගැනීමට සමිතියට බලය ඇති අතර ඒ බව ණය ගිවිසුමට ඇතුළත් විය යුතු ය.

49.11 ඇපකරුවන්ගේ කැමැත්ත ඇතිව මිස ණය ගෙවීමට දී තිබෙන කාල සීමාව දීර්ඝ නොකල යුතුය.

49.12 ණයකට ඇප විය හැක්කේ සාමාජිකයින්ට පමණි. එහෙත් එක් සාමාජිකයෙකුට ඇප විය හැක්කේ සාමාජිකයින් දෙදෙනෙක්ට පමණි.

49.13 සමිතිය විසින් නියම කරන පරිදි ද්‍රව්‍ය හෝ මුදල් වශයෙන් හෝ පොලී සමග ණය ආපසු ගෙවීමට ණයකරුට ණයදෙන අවස්ථාවේදී නියම කිරීමට සමිතියට බලය ඇත.

49.14 ණය දිය හැකි කටයුතුද ඒ එක් එක් කටයුත්ත සඳහා ගන්නා ලද ණය ගෙවීමට දිය හැකි උපරිම කාල සීමාවද සමිතියේ මහසභාව විසින් නියම කල හැකිය. එම නියමයන් සමිතියේ ග්‍රාමීය බැංකු කාර්ය රීති සංග්‍රහයට විධිමත් පරිදි ඇතුළත් කළ යුතු ය.

49.15 සමිතියෙන් නිකුත් කරනු ලබන ඕනෑම ණයක් සඳහා අය කරනු ලබන පොලී ප්‍රමාණය සමිතිය මුදල් ණයට ගන්නා පොලී ප්‍රමාණයට වඩා 6% කට වැඩි නොවිය යුතුය.

49.16 මෙම අතුරු ව්‍යවස්ථාවේ අන් තැනක සඳහන් විධි විධාන කෙසේ වුවද දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් තුමා විසින් පොදු හෝ විශේෂ හෝ නියමයක් මගින් නිර්ණය කරන කොන්දේසි, නියමයන් ප්‍රමාණයන් අනුව ණය සඳහා අය කල යුතු පොලී ප්‍රතිශත පවත්වා ගෙන යා යුතුය.

49.17 මෙම අතුරු ව්‍යවස්ථාවේ අන් තැනක සඳහන් විධි විධාන කෙසේ වුවද සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් තුමා විසින් අනුමත කරන ලද්දා වූ පිළිගත් සුරැකුම් ක්‍රමයක් මගින් ණය ආපසු ගෙවීම රජය විසින් සහතික කරන ලද්දාවූ යම් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන විට එකී ණය යෝජනා ක්‍රමයට විශේෂ වූ නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව එකී ණය යෝජනා ක්‍රමය යටතේ සාමාජිකයන්ට ණය පහසුකම් සැලසීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇතිවේ.

**50. සකසුරුවම්කම**

50.1 සාමාජිකයන් අතර සකසුරුවම්කම දියුණු කිරිම සඳහා ඕනෑම ක්‍රියා පිළිවෙළක් ඇති කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත.

50.2 සමිතිය වෙත ලැබෙන තැන්පත් මුදල් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රශස්තව කටයුතු කල යුතුය.

50.3 තැන්පත් මුදල් ආයෝජනය කල යුත්තේ සමිතියේ ද්‍රවශීලතාවය ආරක්ෂා වන පරිදි ය. සෑම අවස්ථාවකම සමිතියේ තැන්පත් රාශිකරණය, ප්‍රති ආයෝජනය හා නැවත ගෙවීම , පොලී ප්‍රතිශත නිර්ණය හා අදාල වෙනත් කටයුතු සමුපකාර කොමසාරිස්වරයාගේ නියමයන් හා නියාමනයන්ට යටත් විය යුතුය.

**51. වෙළඳාම**

51.1 සමිතියේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා නීත්‍යානුකූල ඕනෑම වෙළඳාමක හෝ කටයුත්තක යෙදීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි ය.

51.2 පාරිභෝගිකයන්ට සාමාන්‍යයෙන් අත්පිට මුදලට ද්‍රව්‍ය විකිණිය යුතුය. එහෙත් ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ වැඩ පිළිවෙළක් යොදා ගැනීමට ද , සාමාජිකයකු විසින් උපදවන ද්‍රව්‍ය හෝ නිපදවන බඩු භාණ්ඩ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන අන්දමට සමිතියට හෝ සමිතිය මගින් හෝ විකිණීමට ලියවිල්ලකින් පොරොන්දු වූ විට හෝ ඔහු විසින් ඔහුගේ නිශ්චල දේපල උකස් කල විට හෝ හෝ ණය නිසි පරිදි කලට වේලාවට ඔහු ගෙවන බවට සහතික කරමින් සතුටුදායක ඇපකරුවන් ලෙස පිළිගත හැකි සමිතියේ සාමාජිකයින් දෙදෙනෙකු විසින් ඇප වශයෙන් ඔප්පුවකට අත්සන් තැබූ විට හෝ ඔහුට ණයට බඩු දීමට ද අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත.

51.3 තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සඳහා අනුමත කරන ලද ඕනෑම ආයතනයකට ණයට භාණ්ඩ දීමට හැක.

51.4 සමිතියට භාරදෙන ලද ද්‍රව්‍ය හෝ බඩු භාණ්ඩ හෝ සමිතියේ පාලනය යටතේ තබන ලද ද්‍රව්‍ය හෝ බඩු භාණ්ඩ හෝ ඇපයට තබාගෙන දෙනු ලබන අත්තිකාරම් මුදල් ඒ ද්‍රව්‍ය වල හෝ බඩු භාන්ඩවල හෝ තක්සේරු කළ වටිනාකමෙන් 75% කට වැඩි නොවිය යුතුය.

51.5 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කලහොත් සෑම සාමජිකයෙක්ම කෘෂිකර්මයෙන් හෝ සත්ව පාලනයෙන් හෝ තමා යෙදී සිටින වෙනත් ගෘහ කර්මාන්තයෙන් හෝ උපදවන ද්‍රව්‍ය හා නිපදවන බඩු භාණ්ඩ හෝ සමිතියට හෝ සමිතිය මගින් හෝ අලෙවි කිරීම සම්බන්ධයෙන් සමිතිය සමග ගිවිසුමකට බැඳී සිටිය යුතුය.

**52. අයිතිවාසිකම් අතහැර දැමීම.**

සමිතියට අයවිය යුතුව ඇති ණයක් හෝ සමිතියේ අයිතියක් හෝ එවැනි ණයක හෝ අයිතියක කොටසක් හෝ අතහැර දැමීමට හෝ සමිතියේ පොත්පත් වලින් අස්කර දැමීමට හෝ සමිතියට බලය ඇති වන්නේ සමුපකාර සමිති පිළිබඳ නීතියේ නියමයන්ට යටත්වය.

**53. මුදල් වර්ෂය**

සමිතියේ මුදල් වර්ෂයකම සෑම අවුරුද්දකම ජනවාරි මස 01 සිට දෙසැම්බර් මස 31 දක්වා වෙයි.

**54. සේවකයින් සම්බන්ධ ව්‍යවස්ථාපිත ගෙවීම් හා වෙන්කිරීම්**

54.1 නීතියෙන් නියම කරන පරිදි සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා එහි නියම කර ඇති පරිදි දායක මුදල් ගෙවිය යුතු ය.

54.2 නෛතික ප්‍රතිපාදනයන්ට අනුව සේවකයන් සඳහා නීතිය මඟින් දක්වා ඇති ප්‍රමාණයන් ඒකී නියමයන්ට අනුව අදාල ආයතන වෙත යොමු කල යුතුයි.

**55. ඉතිරි ලාභ**

55.1 කොමසාරිස්වරයා විසින් නියම කරන ලද පරිදි සමිතියේ ශුද්ධ ලාභයෙන් 25% කට නොඅඩු මුදලක් ව්‍යවස්ථාපිත සංචිතයට එකතු කල යුතුවෙයි.

55.2 කොමසාරිස්වරයා විසින් නියම කරන ලද පරිදි සමිතියේ ශුද්ධ ලාභයෙන් 5% නොඅඩු ප්‍රමාණයක් සමුපකාර සමිති පිළිබඳ නිතිය යටතේ පිහිටුවන ලද සමුපකාර සමිති අරමුදලට ගෙවිය යුතුවෙයි.

55.3 ශුද්ධ ලාභයෙන් ඉතිරි කොටස පහත සඳහන් පරිදි කටයුතු වලට වෙන් කිරීමට සමිතියේ මහසභාවට බලය ඇත.

(අ) සේවකයින්ට පාරිතෝෂික මුදල් ගෙවීම.

(ආ) සමුපකාර සමිති පිළිබඳ නීතියේ නියමයන්ට යටත්ව කොටස් අනුව ලාභාංශ ගෙවීම.

(ඇ) (i) සමිතියට හෝ සමිතිය මගින් හෝ විකුණන ලද ද්‍රව්‍ය හෝ බඩු භාණ්ඩවල ප්‍රමාණය අනුවද,

(ii) සමිතියෙන් මිලයට ගන්නා ලද බඩු වල ප්‍රමාණය අනුවද,

(iii) කොන්ත්‍රාත් වැඩවල හෝ ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩවල හෝ වෙනත් එවැනි ව්‍යාපාරවල යෙදී ඒ ඒ සාමාජිකයා විසින් සමිතියෙන් ලබා ගෙන තිබෙන වැටුප් අනුවද, සාමාජිකයන්ට ප්‍රතිදාන ගෙවීම.

(ඇ) ගොඩනැගිලි අරමුදලකට වෙන් කිරීම.

(ඉ) කොටස් පැවරිමේ අරමුදලකට වෙන් කිරීම.

(ඊ) සමිතියේ මහ සභාවේ අනුමැතිය ඇතිව පිහිටුවන ලද සමිතියේ වෙනත් අරමුදල් වලට වෙන් කිරීම.

(උ) යම් සමාජයීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයක් පිණිස හෝ ප්‍රාදේශිය හෝ මහජන ප්‍රයෝජනය සඳහා වූ වෙනයම් අරමුදලක් සඵල කර ගැනීම පිණිස පොදු සුභ සාධක අරමුදලකට ඉතිරි වන ලාභයෙන් 10% ට වැඩි නොවන මුදලක් වෙන් කිරීම.

55.4 එහෙත් මුදල් තැන්පත්කරුවකු හෝ ණයහිමියකු හෝ ආපසු ඉල්ලා තිබෙන මුදලක් සමිතියෙන් නොගෙවා තිබියදී සාමාජිකයින් හෝ සේවකයන් අතර එසේ ලාභ බෙදිය නොහැක.තවද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු යයි සමිතියේ මහසභාවට නිර්දේශ කරන ලද ප්‍රමාණය ඉක්මවා හෝ කොමසාරිස් තුමාගේ අනුමැතිය කලින් ලියවිල්ලකින් ලබා නොගෙන හෝ ලාභ බෙදීමට බලයක් නැත.සමිතියේ මහ සභාව සහ කොමසාරිස්තුමා විසින් අනුමත කරන ලද ලාභ බෙදීමක් කොමසාරිස් තුමාගේ පූර්ව අනුමැතිය නොමැතිව පසුව පවත්වන සමිතියේ මහසභා රැස්වීමකදී වෙනස් කළ නොහැක.

55.5 සාමාජිකයින්ට ලැබිය යුතු ලාභාංශ හෝ ප්‍රතිදාන හෝ මුදලින් ගෙවීමට හෝ ඒ ගැන සමිතියේ මහ සභාව තීරණය කරන අන් පරිදි ක්‍රියා කිරීමට හෝ සමිතියේ මහසභාවට බලය ඇත.

55.6 සාමාජිකයින්ට ප්‍රතිධාන වශයෙන් ගෙවිය යුතු ප්‍රමාණයත් ඒ ප්‍රමාණය ගණන් ගත යුතු ආකාරයත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කල යුතු වේ.

55.7 යටත් පිරිසෙයින් කොටස් 20 ක් වත් අයිතිකරගෙන නැති යම් කිසි සාමාජිකයකුට ගෙවිය යුතු ලාභාංශ හෝ ප්‍රතිධාන වෙතොත් ඔහුට එවැනි කොටස් ගණනක් අයිති වීම සඳහා ඒ මුදල් යෙදිය යුතු වෙයි. ඉහත සඳහන් පරිදි නොයොදන ලද යම් ලාභ මුදලක් වෙතොත් එය ව්‍යවස්ථාපිත සංචිතයට එකතු කල යුතු වෙයි.

55.8 යමෙකුට ලැබිය යුතු ලාභාංශ හෝ ප්‍රතිධාන හෝ එය ලැබීමට නියම දින සිට හයමසක් තුළදී ඔහු විසින් නොඉල්ලන ලද නම් ඒ මුදල ව්‍යවස්ථාපිත සංචිතයට එකතු කිරීමට සමිතියට බලය ඇත.ඉන්පසු ඒ සඳහා ඉදිරිපත් කරන කිසිම ඉල්ලීමක් පිලිගැනීමට සමිතියට බලයක් නොමැත.

**56. සමුපකාර අරමුදල**

56.1 කොමසාරිස් තුමා වරින් වර නියම කරන පරිදි සමිතිය වර්ෂයක් පාසා සමුපකාර අරමුදලට මුදල් ගෙවිය යුතුය.

56.2 විසර්ජනයට පෙර ලැබෙන ලාභයෙන් විගණකවරයා විසින් නියම කරන ලද මුදල විගණන වාර්තාව සමිතිය වෙත ලැබී දින 90 තුළ සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය.

**57. ව්‍යවස්ථාපිත සංචිතය**

57.1 විසර්ජනයට පෙර ශුද්ධ ලාභයෙන් විගණකවරයා විසින් නියම කරන ලද ව්‍යවස්ථාපිත සංචිතය සාමාජිකයන් අතර බෙදිය නොහැක.

57.2 ඉන් යම් කිසි කොටසක් නියමකර ඉල්ලීමට කිසිදු සාමාජිකයකුට බලය නොමැත.එය සමුපකාර සමිති පිලිබඳ නීතියේ නියමයන්ට යටත්ව යෙදවිය යුතුය.

57.3 සමිතියේ ලාභ අරමුදල්වලට වෙන් කිරීමෙන් පසු ඉතිරිවන මුදල ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතුය.

**58. ආරවුල්**

මෙම අතුරු ව්‍යවස්ථාවල අර්ථ නිරූපනය සම්බන්ධයෙන් හෝ සමිතියේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් කිසි ආරවුලක් ඇති වුවහොත් එය තීරණය කිරීම පිණිස සමුපකාර සමිති පිලිබඳ නිතීය යටතේ කොමසාරිස් තුමාට ඉදිරිපත් කල යුතුය.

**6 කොටස**

**වෙනත් පොදු කරුණු**

**59. ගිවිසුම්**

59.1 සමිතිය වෙනුවෙන් ඇතිකර ගන්නා ගිවිසුම් සම්බන්ධ ලියකියවිලි වල සමිතියේ මුද්‍රාවද සමිතියේ සභාපතිගේ අත්සනද, අධ්‍යක්ෂ මණ්ඩලය නියම කරන පරිදි සමිතියේ ලේකම් හා සාමාන්‍යාධිකාරී යන දෙදෙනාගෙන් එක් කෙනෙකුගේ අත්සන ද 56.3 අතුරු ව්‍යවස්ථාව අනුව තැබිය යුතුය.

59.2 ඒ නිලධාරීන්ගෙන් කවරෙකුගේ වුවද පත් කිරීමේදී ඇති වූ යම් අඩුපාඩු හෝ ඔවුන්ගේ නුසුදුසුකම් හෝ පසුව දැන ගන්නට ලැබුණත් ඔවුන් විසින් අත්සන් කරන ලද්දාවූද, අත්සන් කර ක්‍රියාවෙහි යොදවන ලද්දාවූද, ගිවිසුම්වලට සමිතියේද සාමාජිකයින්ගේද බැඳීම නියම සුදුසුකම් ඇතිව නිසි පරිදි පත් වූ නිළධාරීන් විසින් අත්සන් කරන ලද ගිවිසුම් වලට ඇති බැඳීම හා සමාන වන්නේය.

**60. මුද්‍රාව**

60.1 සමිතියේ පොදු මුද්‍රාව සමිතියේ ලේකම් තැන භාරයේ තිබිය යුතුය.

60.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකින් ලැබෙන බලයක් නැතිව ඔප්පු වැනි විශේෂ ලියවිල්ලක සමිතියේ මුද්‍රාව නොතැබිය යුතුය.

60.3 මුද්‍රාව තබන විට සමිතියේ සභාපතිද සමිතියේ ලේකම් හෝ සාමාන්‍යාධිකාරී තැන යන දෙදෙනාගෙන් එක්කෙනෙකුද ඉදිරියෙහි එය තැබිය යුතුය. මුද්‍රාව තැබීමෙන් පසු ඉහත සඳහන් පරිදි ඉදිරියෙහි සිටි දෙදෙනා එක් එක් ලියවිල්ලට අත්සන් තැබිය යුතුයි.

**61. දඩ අය කිරීම**

61.1 සමිතියේ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම කළහොත් රුපියල් දෙසිය පනහකට(රු.250.00) අධික නොවන දඩයක් අය කල හැකි වන්නේ ය.

61.2 එවැනි දඩයක් ගැසීමට අදහස් කරන බව හා ඊට හේතු ලියවිල්ලකින් සමිතියේ පොත්පත්වල සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දීමට කටයුතු කළ යුත්තේය.

61.3 එම ලියවිල්ලෙන් එකී සාමාජිකයාට දින 14 කාලයක් තුළ නිදහසට කරුණු දැක්වීමට කාලය ලබා දිය යුතුය. සාමාජිකයා විසින් නිදහසට කරුණු අදාල කාලය තුළ සමිතියේ ලේකම් තැනට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීමට ක්‍රියා කළ යුතුය.

61.4 සාමාජිකයා විසින් නිදහසට කරුණු ඉදිරිපත් කළහොත් එම කරුණු නිසි පරිදි කැඳවන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී සලකා බැලිය යුතුය.

61.5 සාමාජිකයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා එම කරුණු ප්‍රමානවත් නොවන බවට තීරණය කර දඩයක් ගැසීමට තීරණය කල අවස්ථාවක හා සාමාජිකයා විසින් නිදහසට කරුණු ඉදිරිපත් නොකළ

අවස්ථාවක රුපියල් දෙසිය පනහක (රු.250.00) උපරිමයකට යටත්ව නිශ්චිතව සඳහන් කරන දඩ මුදලක්, නිශ්චිතව සඳහන් කළ කාලයක දී අය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කල යුතුය.

61.6 එම දඩ මුදල මුදලින් ගෙවීමට එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සාමාජිකයා දැනුවත් කල යුතු අතර ගෙවීම පැහැර හැරියහොත් එම සාමාජිකයාගේ ඉතුරුම් ගිණුමකින් හෝ එම සාමාජිකයාට ගෙවිය යුතු වෙනයම් මුදලකින් අය කර ගත හැකි වන්නේ ය.

**62. අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරිම.**

62.1 සමිතියේ යම් අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීම, සංශෝධනය කිරීම, පරිච්ජින්න කිරීම හෝ අවලංගු කිරීම අතුරු ව්‍යවස්ථා සංශෝධනයකි.

62.2 මෙම අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම සමූපකාර සමිති පිළිබඳ නීතියට යටත්ව

(අ) සමිතියේ මහා සභාවට තෝරා පත්කරන ලදනියෝජිතයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් දෙකෙන් කොටසකට වැඩි ගණනක ඡන්දය අනුව සමිතියේ මහා සභා රැස්වීමකදී සම්මත වූ යෝජනාවකින් හෝ

(ආ) කොමසාරිස්තුමාගේ පූර්ව අනුමැතිය හෝ නිර්දේශය ලැබී ඇති අවස්ථාවක මෙහි අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි ගණපූර්ණයක් ඇතිව පවත්වන ලද මහා සභාවේ සභා රැස්වීමකදී එහි පැමිණ සිටි නියෝජිතයින්ගෙන් තුනෙන් දෙකොටසකගේ ඡන්දය අනුව සභා සම්මත වූ යෝජනාවකින් හෝ පමණක් මේ කළ හැකි වන්නේය.

62.3 අතුරු ව්‍යවස්ථා අංක 57.1 (අ) යටතේ වන රුස්වීමක ඡන්ද ලිඛිතව දිය හැකි වේ. ලිඛිත ඡන්ද ලබා ගන්නා විට ඡන්ද පත්‍රිකා ඒ සියළු දෙනාට යවා, ආපසු ලැබෙන ඡන්ද මෙහි අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි ගණපූර්ණයක් ඇතිව පවත්වන ලද මහා සභා රැස්වීමකදී පරීක්ෂා කර ගණන් කල යුතු වේ.

62.4 අතුරු ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් වලංගු වීමට නම් ඒ සඳහා රැස්කරන සභාව ගැන නිකුත් කරන දැන්වීම් පත්‍රයෙහි ඒ යෝජනාව පිළිබඳ සඳහන් කර තිබිය යුතු වන්නේය.

62.5 කොමසාරිස්තුමා විසින් කැඳවනු ලැබූ සභා රැස්වීමක් නොවේ නම් ඒ සභා රැස්වීම ගැන යටත් පිරිසෙයින් දින 14 ක් වත් කලින් මහා සභාවට පැමිණ ඡන්දය දිය හැකි සියළු සාමාජිකයින්ට දැනුම් දිය යුතු වන්නේය.

62.6 මේ අතුරු ව්‍යවස්ථාවේඅන් තැනක විධාන කෙසේ වෙතත් මහා සභාවක් නිසි පරිදි පිහිටුවන තෙක් මේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීමේ බලය තාවකාලික අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති වන්නේය.

62.7 අතුරු ව්‍යවස්ථාවක කිසිම සංශෝධනයක් කොමසාරිස්තුමා විසින් ලියා පදිංචි කරන තුරු වලංගු නොවේ.

62.8 එසේ ලියාපදිංචි කිරීමට කොමසාරිස්තුමාගෙන් ඉල්ලා සිටින විට ඒ යෝජනාවේ පිටපත් දෙකක් ද, ඒ සම්බන්ධයෙන් මේ අතුරු ව්‍යවස්ථාවල විධාන සර්වප්‍රකාරයෙන්ම ඉටුකළ බවට සමිතියේ සභාපති හා සමිතියේ ලේකම් විසින් අත්සන් තබන ලද සහතික පත්‍රයක්ද ඔහු වෙත යැවිය යුතුය. සමිතියේ මහා සභාව සමන්විත වන නියෝජිතයන්ගේ සම්පූර්ණ ගණනද, සමිතියේ මහා සභා රැස්වීමට පැමිණ සිටි නියෝජිතයින්ගේ සංඛ්‍යාවද, යෝජනාවට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාවද, සමිතියේ මහා සභාව සමන්විත වන නියෝජිතයින්ට ඒ සභා රැස්වීම ගැන දැනුම් දුන් කාලයද, යන කරුනු ඒ සහතික පත්‍රයෙහි සඳහන් කළයුතු වේ. තවද, සමිතියේ මහා සභාවේ ඒ රැස්වීම ගැන නිකුත් කරන ලද දැන්වීමෙහි සඳහන් න්‍යාය පත්‍රයද, කොමසාරිස්වරයා විසින් ඉල්ලා සිටින වෙනත් තොරතුරු ද ඒ සමඟ යැවිය යුතුය.

## 63. ඇවර කිරීම

සමිතිය ඇවර කළ හැක්කේ නීතියේ සඳහන් ආකාරයට කොමසාරිස්තුමාගේ නියමයකින් පමණකි.

## 64. වචනාර්ථ

මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත්

''කොමසාරිස්තුමා'' හෝ ''රෙජිස්ට්‍රාර්තුමා'' යන්නට ''දකුණු පළාතේ සමුපකාර සමිතිවල ට අදාලව රෙජිස්ට්‍රාර්වරයෙක්ගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත්කර ඇති දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්'' හෝ අවස්ථානුකූලව ඔහුගේ බලය විදිමත් පරිදි පවරා ඇති ''සමූපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්'' හෝ ''සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් '' ඇතුළත් වේ.

''සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරියා'' යන්නට ''සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, සමුපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ පළාත් සහකාර කොමසාරිස්, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන්, සමූපකාර සමිතිය භාර සමුපකාර සංවර්ධන නිලධාරී, හෝ සමුපකාර සංවර්ධන නිලධාරීයකු'' ඇතුළත් වේ.

''ඇමතිතුමා'' යන්නට තත් කාලයේ සමූපකාර සංවර්ධන කටයුතු භාර පළාත් ඇමති තුමා හෝ නීතියෙන් එම කාර්ය හා කර්තව්‍යයන් පැවරී ඇති තැනැත්තා ඇතුළත් වේ.

''සමුපකාර නීතිය'' යන්නට තත් කාලයේ සමූපකාර සමිති සඳහා බල පැවැත්වෙන පනත්,ප්‍රඥප්ති,රීති, චක්‍රලේඛ හා උපදෙස් ඇතුළත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ යම් තැනක ඇති ඒක වචන අවශ්‍ය පරිදි බහු වචන ලෙසත්, බහු වචන අවශ්‍ය පරිදි ඒක වචන ලෙසත් අදාළ කර ගත යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ යම් තැනක ඇති පුරුෂ ලිංගික පද අවශ්‍ය පරිදි ස්ත්‍රී ලිංගික පද ලෙස අදාළ කර ගත යුතු ය..

කෞමුපත්‍රි.

## උපලේඛණ අංක 01

**සමිති බල ප්‍රදේශය හා සිතියම (අතුරු ව්‍යවස්ථා අංක 1)**

**උපලේඛණ අංක 02**

**ප්‍රාදේශික බල ප්‍රදේශ (අතුරු ව්‍යවස්ථා අංක 9)**

| ප්‍රදේශ අංකය | ප්‍රදේශය | අයත්වන ග්‍රාම නිලධාරී කොට්ඨාශ | අනුමත දිනට සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**උපලේඛණ අංක 03**

**ප්‍රාදේශික බල ප්‍රදේශ සිතියම (අතුරු  ව්‍යවස්ථා අංක 9)**

## උපලේඛණ අංක 04

**සාමාජික අංක සඳහා කේත (අතුරු ව්‍යවස්ථා අංක 10.1)**

**දිස්ත්‍රික්කය - .................................. කේතය**

**සමිතිය - සීමා සහිත ........................................ විවිධ සේවා සමුපකාර සමිතිය**

**සමිති කේතය**

**ප්‍රාදේශික අංකය - දෙවන උපලේඛණයේ සඳහන් පරිදි වේ.**

**සාමාජික අංකය - අනුක්‍රමික අංකය වේ.**

උපලේඛණ අංක **04** - දිවිරුම් ප්‍රකාශය ප්‍රාදේශික කාරක සභා
අතුරු ව්‍යවස්ථා අංක **25.7**

සෞම්‍යපති.

**උපලේඛණ අංක 04 - දිවුරුම් ප්‍රකාශය - අධ්‍යක්ෂ මණ්ඩල**
**අතුරු ව්‍යවස්ථා අංක 37.2**

කෙටුම්පත්.

සීමා සහිත ................................ විවිධ සේවා සමූපකාර සමිතිය ලියා පදිංචි කිරීමට අදාලව ..................... දින ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන ලද හා වරින් වර සංශෝධනයට ලක් වූ අතුරු ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට තත් කාලයේ බල පැවැත්වෙන සමූපකාර නීතියට අනුව සකස් කර .................... දින මහා සභා නියෝජිතයන් ........... සහභාගිත්වයෙන් පැවති මහා සභාවට යොමු කරන ලදුව එම මහා සභාරැස්වීමේ සාමාජිකයන් .... දෙනෙකුගේ කැමැත්තෙන් සම්මත කරන ලද්දේය. එම අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා සංශෝධනය .................. දින සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කරමු.

........................................ ...................................

ලේකම් සභාපති

මෙම අතුරු ව්‍යවස්ථා සංශෝධනය ......................... දින .................. දිස්ත්‍රික් සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ලියාපදිංචි කරන ලදි.

.......................................................

සමූපකාර සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්,

දිනය - ....................................................

අතුරු ව්‍යවස්ථා සංශෝධන

| අතුරු ව්‍යවස්ථා අංකය | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලද දිනය | මහා සභා තීරණය ලද දිනය | කොමසාරිස්වරයා අනුමත කල දිනය, අත්සන හා නිල මුද්‍රාව | සංශෝධනය අලවා ඇති පිටුව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| අතුරු ව්‍යවස්ථා අංකය | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලද දිනය | මහා සභා තීරණය ලද දිනය | කොමසාරිස්වරයා අනුමත කල දිනය, අත්සන හා නිල මුද්‍රාව | සංශෝධනය අලවා ඇති පිටුව |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| අතුරු ව්‍යවස්ථා අංකය | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලද දිනය | මහා සභා තීරණය ලද දිනය | කොමසාරිස්වරයා අනුමත කල දිනය, අත්සන හා නිල මුද්‍රාව | සංශෝධනය අලවා ඇති පිටුව |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

**සංශෝධන ඇලවීම සඳහා**

**සහකාර කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් නිලධාරීන්, මූලස්ථාන සංවර්ධන නිලධාරීන් ඇතුළු සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් වෙත,**

දකුණු පළාතේසමුපකාර සමිති සඳහා වන නව නෛතික ප්‍රතිපාදනයන්ට අනුව සකස් කරන ලද විවිධ සේවා සමුපකාර සමිති සඳහා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත මේ සමඟ ඉදිරිපත් කර ඇත. එය අධ්‍යයනය කර ඔබගේ අදහස් හා යෝජනා 2026.01.14 දිනට පෙර මා වෙත යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. මෙම කෙටුම්පත දකුණු පළාත් සමුපකාර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ද යොමු කර ඇත.

සමුපකාර සමිති භාර සංවර්ධන නිලධාරීන් මඟින් සමිති වෙත යොමු කර ඔවුන්ගේ අදහස් හා යෝජනා ද 2026.01.14 දිනට පෙර යොමු කිරීමට දැනුවත් කරන ලෙස ද දන්වමි. මෙම නව අතුරු ව්‍යවස්ථාව 2026.03.01 දින වන විට ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බැවින් මේ සඳහා ඔබගේ ප්‍රමුඛ අවධානය යොමු කිරීම වැදගත් වේ.

**සී වික්‍රමසිංහ - සමුපකාර සංවර්ධන කොමසාරිස් - දකුණු පළාත**